අමාත්‍ය මණ්ඩල කාර්යාලය

කාර්යසාධන වාර්තාව

2012

ජනරජ ගොඩනැඟිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ - 01.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය

"විධායකයට සහාය වන විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම.........."

පෙළ ගැස්ම

1. හැඳින්වීම 1-2

1.1 දැක්ම 1

1.2 මෙහෙවර 1

1.3 අරමුණු 1

1.4 ක්‍රියාකාරකම් 1-2

2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය 3-7

2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන් 3-5

2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු 6

2.3 විවිධ විෂයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන් 6

2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි 6

2.5 අමාත්‍ය මණ්ඩලය වෙත භාරදෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම 6

2.6 අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු 7

2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම 7

3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විවිධ අංශ හා ඒවාට පැවරී ඇති කාර්යභාරයන් 8-10

3.1 සංදේශ අංශය 8

3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය 8-9

3.3 පරිගණක අංශය 9

3.4 ආයතන හා සේවා අංශය 9

3.5 ගිණුම් අංශය 10

4.	**2012 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය**	**11-19**
4.1	අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්	11
4.2	අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු	11-15
4.3	විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු	16
4.4	2012 වසරේදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉටු කරන ලද අතිරේක රාජකාරි	16-17
4.5	රාජ්‍ය ව්‍යවසායයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව 2012-06-27 දිනැති තීරණය ක්‍රියාත්මක කිරීම	18
4.6	කොන්ත්‍රාත් පිරිවැය විචල්‍යතා ගැළපීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම පිළිබඳ 2012-07-12 දිනැති තීරණය ක්‍රියාත්මක කිරීම	18
4.7	2012 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් පාර්ශ්වකරුවකු ලෙස නම් කෙරුණු නඩු හා නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ ඉල්ලා සිටින ලද නඩු	19
5.	**අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය**	**20**
6.	**මානව සම්පත් කළමනාකරණය**	**21-23**
6.1	2012-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු	21
6.2	2012-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය	21
6.3	2012 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්	21
6.4	විශ්‍රාම ගැනීම්	22
6.5	ස්ථාන මාරුවීම්	22
6.6	පුහුණුව හා සංවර්ධනය	22-23

7.	**මූල්‍ය සමාලෝචනය**	**24-25**
7.1	ඇස්තමේන්තු	24
7.2	නිලධාරින් සඳහා ණය අත්තිකාරම් ලබාදීම	24
7.3	ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම	25
7.4	වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම	25
7.5	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම	25
7.6	විගණන විමසුම්	25

ඇමුණුම්

I වන ඇමුණුම - අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද "අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශ ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ" යන සටහන - 2011-06-10

II වන ඇමුණුම - 2012 වසරේ එක් එක් අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ

III වන ඇමුණුම - රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණය - 2012-06-27

IV වන ඇමුණුම - කොන්ත්‍රාත්තු පිරිවැය විචල්‍යතා ගැළපීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය - 2012-07-04

V වන ඇමුණුම - අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද විනය නියෝගයන්ට එරෙහිව අභියාචනා කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණය - 2012-11-14

VI **වන ඇමුණුම** - විසර්ජන ගිණුම - 2012

VII **වන ඇමුණුම** - රජයේ නිලධාරින්ට අත්තිකාරම් "බී" ගිණුම - සැසඳුම් ප්‍රකාශය 2012

VIII **වන ඇමුණුම** - විගණන විමසුම් සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය

1. හැඳින්වීම

1.1 දැක්ම

විධායකයට සහාය වන විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම.

1.2 මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) අනුව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳ විධානයට අදාළ කාර්යයන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සහාය සේවාවන් කාර්යක්ෂම ලෙස ලබා දීම.

1.3 අරමුණු

අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් ඉදිරිපත් කෙරෙන යෝජනා සම්බන්ධයෙනුත්, අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු වන වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙනුත් ඒවායේ ප්‍රතිපත්ති හා නෛතික සංකූලතා පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ජාතියේ හිත පිණිස යෝග්‍යතම තීරණයන්ට එළඹිය හැකිවනු පිණිස අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට උපරිම අයුරින් අවශ්‍ය සහාය සැපයීම.

1.4 ක්‍රියාකාරකම්

(i) අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ උපදෙස් අමාත්‍යාංශ වෙත නිකුත් කිරීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මඟපෙන්වීම සහ පැහැදිලි කිරීම් ඔවුන් වෙත ලබා දීම.

(ii) ජනරජයේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳව විධානය සහ ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත්, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයෙන් යුතුව තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩල සංදේශවලට නිරීක්ෂණ ලබාගැනීම සඳහා අදාළ අමාත්‍යවරුන් වෙත යොමු කිරීම.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.

(v) අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ නිරීක්ෂණ සමඟ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කිරීම.

(vi) අමාත්‍ය මණ්ඩලයේ රැස්වීම්වල සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වල වාර්තා භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එකී වාර්තා ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම.

(vii) අමාත්‍ය මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වලට අවශ්‍ය සියලු සහාය සේවාවන් සැලසීම.

(viii) අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අදාළ අමාත්‍යාංශ වෙත දැනුම් දීම.

(ix) වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කිරීම.

(x) අමාත්‍ය මණ්ඩල තීරණයන්ට එරෙහිව හෝ වෙනත් අයුරකින් අමාත්‍ය මණ්ඩලය වගඋත්තරකරුවන් ලෙස දක්වමින් පවරා ඇති නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා නීතිපතිවරයා වෙත තොරතුරු සැපයීම.

(xi) අතිගරු ජනාධිපතිතුමාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ හෝ නියමයන් මත පැවරෙන වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය

ජනරජයේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳ විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදයේ 51 ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

අතිගරු ජනාධිපතිතුමාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරව එකී කටයුතු කිරීම සඳහාත්, අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පවරනු ලබන්නා වූ වෙනත් යම්කිසි කර්තව්‍යයක් හෝ කාර්යයක් හෝ වේ නම් එකී කර්තව්‍ය හෝ කාර්යය ඉටු කිරීම සඳහාත් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාට සහාය වීම මෙම කාර්යාලයේ වගකීම වේ.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයන් ප්‍රධාන වශයෙන් පහත පරිදි දැක්විය හැකිය:

2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන්:

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් මෙම කාර්යාලය වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තා, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අදාළ කාර්යසාධන වාර්තා හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ වාර්ෂික වාර්තා හා ගිණුම්, අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශවලට හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නිකුත් කරනු ලැබ ඇති I වන ඇමුණුමෙහි දැක්වෙන උපදෙස්වලට අනුකූලව ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කර බලා, එම ලේඛන මෙම කාර්යාලය විසින් භාර ගනු ලැබේ.

මෙසේ භාර ගනු ලබන සෑම අමාත්‍ය මණ්ඩල සංදේශයකටම අනන්‍ය වූ අංකයක් ලබා දෙන අතර, එක් එක් සංදේශය සඳහා ලබා දෙන එම අංකය යටතේ එම සංදේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ. එසේ ලියාපදිංචි කරනු ලැබූ මෙම අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ වන පරිදි, ගරු අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කෙරේ.

සාමාන්‍යයෙන් සිකුරාදා දිනය වනවිට, එළඹෙන සතියේ පැවැත්වීමට නියමිත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කර අවසන් කරනු ලබන අතර එම න්‍යාය පත්‍රය, එයට ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශ ගොනුව හා පසුගිය අමාත්‍ය මණ්ඩල රැස්වීමේ කෙටුම්පත් වාර්තාව එළඹෙන සඳුදා දින පෙරවරුවේ ගරු අමාත්‍යවරුන් වෙත භාර දෙනු ලැබේ.

එළඹෙන සතියට නියමිත අමාත්‍ය මණ්ඩල සංදේශ ගරු අමාත්‍යවරුන් වෙත භාර දීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත දිනය දක්වා ඒ ඒ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අතුරින් අතිගරු ජනාධිපතිතුමාගේ

උපදෙස් අනුව, ජාතියේ හිත පිණිස වහා තීරණ ගත යුතු සහ වෙනත් සුවිශේෂ තත්ත්වයන් යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් නොපමාව සලකා බැලිය යුතු යයි සලකනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ ඇතුළත් කර පරිපූරක න්‍යාය පත්‍රයක් සකස් කොට එය අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලැබේ.

එසේම විෂය භාර ගරු අමාත්‍යවරුන් විසින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව, විශේෂිත හා හදිසි කරුණු යටතේ වන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා සභාගත කරනු ලැබේ.

එසේ ඉදිරිපත් කරනු ලබන සියලුම අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තීරණ ගැනීම පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීමද මෙම කාර්යාලයෙන් ඉටු වන වැදගත් කර්තව්‍යයකි.

අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව, රටේ ජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ ඇතුළත් වාර්තාවක් එදිනම සකස් කොට එය ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිතුමා වෙත වහාම යොමු කෙරේ. (කෙසේ වුවද, ඊළඟ සතියේ පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සම්මත කිරීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක කළ යුතුව ඇති ඇතැම් අමාත්‍ය මණ්ඩල තීරණ සහ එම රැස්වීමේදී සංශෝධනය වීමට ඉඩ ඇතැයි සිතිය හැකි තීරණ එම වාර්තාවට ඇතුළත් නොකෙරේ).

ඒ ඒ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ අතුරින් වහා කටයුතු කළ යුතු යැයි අදහස් කරනු ලබන කෙටුම්පත් තීරණ ඉතා ඉක්මනින් ෆැක්ස් මඟින් අදාළ අමාත්‍යාංශ වෙත යවනු ලැබේ.

අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ ඇතුළත් කොට අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව සකස් කිරීම අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන දින (2012 වසරේ සාමාන්‍යයෙන් බදාදා දිනවල) රාත්‍රියේදීම අරඹන අතර එය භාෂාත්‍රයෙන්ම සකස් කර ඊළඟ සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය හා අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සමඟ ගරු අමාත්‍යවරුන් වෙත එළඹෙන සඳුදා හෝ ඊට පෙර ගෙන ගොස් භාර දෙනු ලැබේ.

කලින් පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණ, ඊට පසුව එළඹෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සම්මත කෙරුණු පසු, භාෂාත්‍රයෙන් සකස් කොට, එකී තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කෙරේ.

ඉහත විස්තර කළ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන් පහත සටහන ඇසුරෙන් සංක්ෂිප්තව දැක්විය හැකිය:

අදාළ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් අමාත්‍ය මණ්ඩල කාර්යාලයට භාර දීම

↓

මාර්ගෝපදේශ හා අනුකූල වේ නම් එකී අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් භාර ගැනීම හා භාරගත් අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් අංක කිරීම හා ලියාපදිංචිය

↓

ලියාපදිංචි කෙරුණු අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් පිළිබඳ මූලික අධ්‍යයනයකින් පසුව හා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඉදිරිපත් කිරීමට පෙර, එම සංදේශවල යෝජනා ඒ සම්බන්ධයෙන් ඍජුවම අදාළත්වයක් ඇති ගරු අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කිරීම

↓

න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළ නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් ගැඹුරින් අධ්‍යයනය කිරීම

↓

කලින් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ කෙටුම්පත් වාර්තාව හා ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගැනීමට නියමිත අමාත්‍ය මණ්ඩල සංදේශ ගොනුව සහ ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දීම

↓

පරිපූරක න්‍යාය පත්‍රයක් සකස් කොට අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කිරීම (ජාතියේ හිතසුව පිණිස වන පමා කළ නොහැකි යෝජනා) → අමාත්‍ය මණ්ඩල රැස්වීම ← හදිසි අමාත්‍ය මණ්ඩල සංදේශ සභාගත කිරීම

↓

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා මඟින් ජනමාධ්‍ය වෙත මාධ්‍ය නිවේදනය නිකුත් කිරීම

↓

අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව සකස් කිරීම

↓

ඉතා ඉක්මනින් ක්‍රියාවට නැංවිය යුතු කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල තීරණ ෆැක්ස් මඟින් කඩිනමින් අදාළ අමාත්‍යාංශ වෙත යැවීම

↓

සම්මත කෙරුණු තීරණ අවශ්‍ය කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ හා අදාළ අනෙකුත් ආයතන වෙත යැවීම

2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අමාත්‍යවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව, ප්‍රථම කොට, අවශ්‍ය පරිදි, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයන්ගේද සහාය ඇතිව, ගැඹුරින් අධ්‍යයනය කොට, අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස ඒ ඒ විෂයට අදාළ වන පරිදි ගරු අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා පිහිටුවා ඇති අතර, එසේ පිහිටුවනු ලැබූ පහත සඳහන් අනුකාරක සභා 2012 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

- (අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව;
- (ආ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව;
- (ඇ) විදුලිබල හා බලශක්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව; සහ
- (ඈ) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් පරීක්ෂා කර බලා, නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පත් කරනු ලැබ ඇති ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව.

2.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන්:

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළ කරුණු පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කොට, නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරනු ලබන නිලධාරි කමිටු සමඟ සම්බන්ධීකරණය කොට අදාළ වාර්තා නියමිත දිනට ලබාගැනීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති වගකීමකි.

2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි:

අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වෙත අතිගරු ජනාධිපතිතුමා විසින් සහ අමාත්‍ය මණ්ඩලය විසින් වරින් වර විශේෂිත රාජකාරි පවරනු ලබන අතර, එම කර්තව්‍යයන් සහ වගකීම් කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීමද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයන්ට අයත් වේ.

2.5 අමාත්‍ය මණ්ඩලය වෙත භාරදෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම:

අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි වරින් වර මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ වගකීමක් වේ.

2.6 අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු:

අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අතුරින් සුවිශේෂ වැදගත්කමකින් යුත් තීරණ ඒ ආකාරයෙන්ම නියමිත කාලවකවානු තුළදී ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීමේ අරමුණින් හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී පැන නැගෙන ගැටලු කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් එකී තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කරනු ලබයි.

2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම:

අමාත්‍ය මණ්ඩලයේ කාර්යයන්ට අදාළව ජනාධිපති කාර්යාලය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ඇතුළුව සියලුම අමාත්‍යාංශද රජයේ අනෙකුත් ආයතන සමඟ මෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟද සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් කරනු ලබයි.

3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විවිධ අංශ හා ඒවාට පැවරී ඇති කාර්යභාරයන්:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා කාර්යාලය තුළ පහත ආකාරයේ විවිධ අංශ ස්ථාපිත කර එකී අංශවලට අදාළ රාජකාරි පවරා වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස දෛනික රාජකාරි කටයුතු ඉටු කරගැනීම පිණිස පියවර ගෙන ඇත.

3.1 සංදේශ අංශය:

පහත සඳහන් කර්තව්‍යයන් මෙම අංශය වෙත පැවරී ඇත:

(i) ලියාපදිංචි කෙරුණු අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් පිළිබඳ මූලික අධ්‍යයනයකින් පසුව හා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඉදිරිපත් කිරීමට පෙර, එම සංදේශවල යෝජනා, ඒ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කිරීම

(ii) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත අමාත්‍ය මණ්ඩල රැස්වීම් හා අනුකාරක සභා රැස්වීම් සඳහා වන න්‍යාය පත්‍ර සහ පරිපූරක න්‍යාය පත්‍ර පිළියෙල කිරීම.

(iii) ගරු අමාත්‍යවරුන්ගේ පහසු විමර්ශනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් අනුමත කරන ලද පරිදි, පෙර රැස්වීමෙහි කෙටුම්පත් තීරණ/වාර්තා ඇතුළත් වාර්තාව සමඟ, මීළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශවල පිටපත් සහ, මෙකී න්‍යාය පත්‍රය අන්තර්ගත වන ගොනු සකස් කිරීම.

(iv) ඉහත පරිදි සකසන ලද සංදේශ සහ කෙටුම්පත් වාර්තාව අඩංගු ගොනු ප්‍රමාදයකින් තොරව ගරු අමාත්‍යවරුන් වෙත බෙදා හැරීම.

(v) සම්මත කරනු ලබන අමාත්‍ය මණ්ඩල තීරණ ඒ ඒ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට හා අනෙකුත් බලධාරීන් වෙත බෙදා හැරීම.

3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අවසන් නිමැවුම ලෙස සැලකිය හැකි, අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ අන්තර්ගත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව ත්‍රෛභාෂාවන්ගෙන් සැකසීම සඳහා මෙම ඒකකය සුවිශාල දායකත්වයක් ලබා දෙයි. එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර අදාළ විෂයයන් සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ, අදාළ නීතිමය කරුණු හා අදාළ වෙනත් සියලු කරුණු සලකා බලමින් පුළුල් කාර්යභාරයක නිරත වන මෙම ඒකකයේ නිලධාරීහු අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරුන්ගේ ඍජු හා සමීප අධීක්ෂණය යටතේ පහත කාර්යයන්වල නියැළෙති:

(i) අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වල වාර්තා හා එවන් රැස්වීම්වලට අදාළ තීරණ සකස් කිරීම.

(ii) අමාත්‍ය මණ්ඩලයට සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ට ඉදිරිපත් කෙරෙන අනෙකුත් සියලු වාර්තා සැකසීම.

(iii) රජයේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තියට අනුගත වෙමින් අමාත්‍ය මණ්ඩලය වෙත හා අනුකාරක සභා වෙත ඉදිරිපත් කරනු ලබන අනෙකුත් සියලුම වාර්තා භාෂාත්‍රයෙන් (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) පිළියෙල කිරීම.

3.3 පරිගණක අංශය:

මෙම අංශය විසින් පහත කර්තව්‍යයන් ඉටු කරනු ලබයි:

(i) භාෂාත්‍රයෙන් පිළියෙල කරනු ලබන අමාත්‍ය මණ්ඩල රැස්වීම් වාර්තා, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් වාර්තා හා අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කරනු ලබන වෙනත් වාර්තා හා ලියකියවිලි භාෂාත්‍රයෙන් පරිගණකගත කිරීම

(ii) මහජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ හා වෙනත් අදාළ තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ වෙබ් අඩවියේ පළ කිරීම.

3.4 ආයතන හා සේවා අංශය:

කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලු සහාය සේවාවන් හා පහසුකම් සලසන ඒකකය වශයෙන් ආයතන හා සේවා අංශය කටයුතු කරනු ලබයි.

මෙම අංශය වෙත පහත සඳහන් ආකාරයේ කර්තව්‍යයන්ද පැවරී ඇත:

(i) දෛනික තැපෑලට අදාළ රාජකාරි කටයුතු;

(ii) කාර්යාලයේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු;

(iii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වෙත ලිපි බෙදා හැරීම;

(iv) නිලධාරින් පුහුණු කටයුතු සඳහා යොමු කිරීම;

(v) කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීම හා නිලධාරීන්ගේ උසස්වීම්වලට අදාළ කටයුතු;

(vi) පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ සියලු ආයතනික හා පාලන කටයුතු;

(vii) කාර්යාලය සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු; සහ

(viii) ප්‍රවාහන පහසුකම්/පණිවුඩ සහ සුබසාධන සේවාවන් ලබා දීම.

3.5 ගිණුම් අංශය:

මෙම අංශය වෙත පහත කර්තව්‍යයන් පැවරී ඇත:

(i) කාර්යාලයේ සියලුම ගිණුම් කටයුතු මෙහෙයවීම හා වාර්තා කිරීම.

(ii) කාර්යාලය සඳහා අවශ්‍ය අක්මුදල් ලබාගැනීම සඳහා බැංකු ගිණුම් පවත්වාගෙන යාම;

(iii) භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින වාර්තා ඉදිරිපත් කිරීම;

(iv) කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම් සහ ඊට ආනුෂංගික කටයුතු.

(v) වැය ඇස්තමේන්තු සකස් කිරීම;

(vi) මූලධන වත්කම් ප්‍රසම්පාදනයට අදාළ කරුණු;

(vii) විගණන විමසුම්වලට අදාළ සියලු මූලික කටයුතු ඉටු කිරීම.

4. 2012 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය:

4.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්:

2012 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් 40 ක් පවත්වන ලද අතර විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ 1,792 ක් එම රැස්වීම්වලදී අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබ ඇත. (ඒ ඒ අමාත්‍යාංශ විසින් 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව **II වන ඇමුණුමෙහි** දැක්වේ).

මෙකී සංදේශ සම්බන්ධයෙන් නිරීක්ෂණ අදාළ අමාත්‍යාංශ වෙතින් ලබාගැනීමද අවශ්‍ය අවස්ථාවන්හි අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඊට සමාන්තරව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින් එම පත්‍රිකා පිළිබඳ නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම හා එම යෝජනාවලින් පැන නඟින සංකූලතා ආදිය ගැන ගැඹුරින් අධ්‍යයනය කිරීමද අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සිදු කරන ලදී.

අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ 1,792 ට අදාළව එළඹි තීරණ ඇතුළත් වාර්තා මෙම කාර්යාලය විසින් භාෂාත්‍රයෙන්ම සකස් කර ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙතත් යොමු කරන ලදී.

කාණ්ඩය	**සංදේශ ගණන**
ප්‍රතිපත්තිමය කටයුතු	930
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු ආයතනික කටයුතු	400
ප්‍රසම්පාදන	170
වාර්ෂික වාර්තා	292
එකතුව	1,792

4.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

(අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පහත සඳහන් බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත:

(i) රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම [55(1) ව්‍යවස්ථාව].

(ii) දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම [55(2) ව්‍යවස්ථාව].

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍යතම තීරණයට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට පහසු වනු පිණිස අමාත්‍යාංශවලින් ඉදිරිපත් කෙරුණු සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව 2012 වසරේදීද ක්‍රියාත්මක විය.

- ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා,
  යහපාලනය හා යටිතල පහසුකම් පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය - (සභාපති) ;
- ගරු ඩී.ඊ.ඩබ්ලිව්.ගුණසේකර මැතිතුමා,
  මානව සම්පත් පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය;
- ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා,
  ග්‍රාමීය කටයුතු පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය;
- ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,
  වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය;
- ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
  සෞඛ්‍ය අමාත්‍ය;
- ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා මැතිතුමා,
  පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය;
- ගරු රවුෆ් හකීම් මැතිතුමා,
  අධිකරණ අමාත්‍ය;
- ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා,
  රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය;
- ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා,
  අධ්‍යාපන අමාත්‍ය;
- ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා,
  ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය; සහ
- ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා,
  පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය;

විවිධ අමාත්‍යාංශ වෙතින් 2012 වර්ෂය තුළදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ විෂයපථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 400 ක් ඉදිරිපත් වී තිබූ අතර, එම සංදේශ පිළිබඳව සාකච්ඡා කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් 23 ක් පවත්වන ලදී. අනුකාරක සභාව විසින් දෙන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. මෙම කාර්යභාරය සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ අතර එම නිලධාරී කමිටුව සහභාගි වූ රැස්වීම් 23 ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී පැවැත්විණි.

(i) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්;

(ii) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්/අතිරේක ලේකම්;

(iii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්;

(iv) ආයතන අධ්‍යක්ෂ ජනරාල්;

(v) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්;

(vi) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්;

(vii) ආරාධනා මත අදාළ අමාත්‍යාංශවල නිලධාරින් (අවස්ථානුකූලව) ; සහ

(viii) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරුන් ඇතුළු අදාළ අනෙකුත් නිලධාරින්.

එසේම අවශ්‍ය අවස්ථාවලදී වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමටද කටයුතු කරන ලද අතර, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා, ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශ 400 සම්බන්ධයෙන්ම සිය තීරණ ලබාදී ඇති අතර, එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් ආයතන වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් දන්වා යවනු ලැබ ඇත.

මෙම කාර්යභාරයට අතිරේකව, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) අනුව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම පිළිබඳ කටයුතුද 55(1) ව්‍යවස්ථාව යටතේ වන රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණා සඳහා විධිවිධාන සැලසීම හා එම කරුණු තීරණය කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමද ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් සිදු කරන ලදී.

(ආ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

අලුතින් නීති සම්පාදනය කිරීම සඳහා හෝ පවතින නීතියක් සංශෝධනය කිරීම සඳහා හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වන පනත් කෙටුම්පත් ඇතුළත් සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර, සිය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් ගරු අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී:

- ගරු ඒ.ඩී.සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා,
  ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය - (සභාපති);

- ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා,
  ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය;

- ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා,
  ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය;

- ගරු රවුෆ් හකීම් මැතිතුමා,
  අධිකරණ අමාත්‍ය;

- ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා,
  ආර්ථික සංවර්ධන අමාත්‍ය;

- ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා,
  ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය;

- ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා,
  රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය;

- ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය,
  තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය;

- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා,
  පරිසර අමාත්‍ය; සහ

- ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා,
  විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය.

එම අනුකාරක සභාවට සහායවීම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය සහ අදාළ අමාත්‍යාංශයන්හි නියෝජිතයන්ගෙන් සැදුම්ලත් නිලධාරි කමිටුවක් 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලදී.

ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් යොමු කරනු ලැබූ අතර, ඉන් 07 ක් සඳහා සිය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය. එම නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කරන ලදී.

(ඇ) විදුලිබලය හා බලශක්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

විදුලිබලය හා බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්තිය සහ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රසම්පාදනය හා බෙදා හැරීම ඇතුළු එම අංශයේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම පිණිස පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව 2012 වර්ෂයේදීද ක්‍රියාත්මක විය:

- ගරු ඒ.එච්.එම්.ෆවුසි මැතිතුමා,
  නාගරික කටයුතු පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය - (සභාපති);
- ගරු ඒ.ඩී.සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා,
  ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය;
- ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා,
  විදුලිබල හා බලශක්ති අමාත්‍ය;
- ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා
  රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය; සහ
- ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා,
  විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍ය.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙක්, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා වන ලේකම් කාර්යාලයේ සම-ප්‍රධාන විධායක නිලධාරි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරි මෙම අනුකාරක සභාව සඳහා සහාය වූහ. 2012 වර්ෂයේදී මෙම අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ 02 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන වෙත යොමු කරන ලදී.

(ඈ) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් පරීක්ෂා කර බලා, නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පත් කරනු ලැබ ඇති ජ්‍යෙෂ්ඨ අමාත්‍ය අනුකාරක සභාව:

2011-06-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් වශයෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් පරීක්ෂා කර බලා, අමාත්‍ය මණ්ඩලය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, යහපාලනය හා යටිතල පහසුකම් පිළිබඳ (ජ්‍යෙෂ්ඨ) අමාත්‍ය, ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත්, සියලුම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් පත් කරනු ලැබ ඇත:

එම අනුකාරක සභාව විසින් 2012 වර්ෂයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 13 දෙනෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 27 ක් අතුරින් පනත් කෙටුම්පත් 22 ක් සඳහා වන සිය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන වෙත යොමු කරන ලදී.

4.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු:

අමාත්‍යාංශ 19 ක් විසින් ඉදිරිපත් කරන ලද සංදේශ 18 කට අදාළ කරුණු පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් නිලධාරී කමිටු 23 ක් 2012 වර්ෂයේදී පත්කරන ලද අතර, ඒ අතුරින් කමිටු 10ක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කොට ඒ සඳහා වන අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන වෙත යොමු කරන ලදී.

4.4 2012 වසරේදී අමාත්‍ය මණ්ඩලය කාර්යාලය විසින් ඉටු කරන ලද අතිරේක රාජකාරි:

(I) **රාජ්‍ය නිලධාරින් විසින් ලබා ගත යුතු භාෂා ප්‍රවීණතාව පිළිබඳව කරුණු අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම**

ඉහත කාර්යය සඳහා 2012-05-23 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් පහත දැක්වෙන නිලධාරි කමිටුව පත් කරන ලදී:

(i) අමාත්‍ය මණ්ඩලයේ ලේකම් (සභාපති);

(ii) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්;

(iii) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් - (කැඳවුම්කරු*);

(iv) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයකු;

(v) ආයතන අධ්‍යක්ෂ ජනරාල්;

(vi) විභාග කොමසාරිස් ජනරාල්;

(vii) රාජ්‍ය භාෂා කොමසාරිස්;

(viii) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජිතයකු**.

ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් ඉහත කී නිලධාරි කමිටුවේද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේද සහාය ඇතිව මෙම කරුණට අදාළ වන විද්වතුන්, රාජ්‍ය සේවයේ වෙනත් බලධරයන් හා ඇතැම් වෘත්තිය සමිති ඇතුළු අදාළ අනෙකුත් පාර්ශ්වයන් සමඟ සාකච්ඡා රාශියක් පවත්වනු ලැබීය.

---

* ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කමිටු රැස්වීම් කැඳවීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සිදු කරන ලදී.

** අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පෞද්ගලිකවම රැස්වීම්වලට සහභාගි විය.

(II) **රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව තිබූ, 2009-04-09 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ (එම කොමිෂන් සභාව වෙනුවෙන්) අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගයන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව 2012-10-31 දිනැති (2012-11-14 දින රැස්වීමේදී සංශෝධනය කරන ලද) අමාත්‍ය මණ්ඩල තීරණය නිකුත් කිරීම (V වන ඇමුණුම).**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති කාලපරිච්ඡේදය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගයන් හේතුවෙන් අතෘප්තියට පත් රාජ්‍ය සේවකයකුට, තමන්ට එරෙහිව ලබාදී ඇති විනය නියෝග යළි සලකා බලන ලෙස ඉල්ලීමක් ප්‍රථමයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමටත්, එම කොමිෂන් සභාවේ තීරණයෙන් තෘප්තියට පත් නොවන්නේ නම් ඔහුට හෝ ඇයට එකී තීරණය ලැබීමෙන් සති හතරක (04) කාල සීමාවක් තුළදී පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීමටත් මෙම තීරණය මඟින් අවකාශය සැලසුණි.

ඒ අනුව, ඉහත තීරණය මඟින් 2009-04-09 දින සිට 2011-05-12 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති සමය තුළ, එකී කොමිෂන් සභාව එසේ අක්‍රියව නොපැවතියේ නම් එම කොමිෂන් සභාවේ විෂය පථයට පත් විය හැකිව තිබූ විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ මඟින් අතෘප්තියට පත් නිලධාරින් විසින් තීරණයේ සඳහන් කරුණුවලට අදාළව එකී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති හෝ ඉදිරිපත් කරනු ලබන හෝ පෙත්සම් එම කොමිෂන් සභාව විසින් සලකා බැලීමට යථායෝග්‍ය සුවිශේෂ හේතූන් කවරේද යන්න දක්වන ලදී.

(III) **2013 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පතට අදාළව නීතිපතිවරයාගෙන් කරුණු පැහැදිලි කරගැනීම**

2013 විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් කරුණුවලට අදාළව මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා ඉදිරිපත් කළ සංදේශයේ සඳහන් කර ඇති අදහස් දැක්වීම් පිළිබඳව 2012-11-28 දිනැති රැස්වීමේදී සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය යෝජිත සංශෝධන විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කළහොත් රාජ්‍ය මූල්‍ය කටයුතු කරගෙන යාම කෙරෙහි බරපතළ බලපෑම් ඇති කළ හැකි බව නිරීක්ෂණය කරන ලදුව අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක සහ භාණ්ඩාගාරයේ ලේකම් විමසමින් සංදේශයේ අන්තර්ගත කරුණු නීතිපතිතුමාගේ අවධානයට යොමු කොට 2013 විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කරගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව උපදෙස් ලබාගෙන එකී උපදෙස් සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට නියම කරන ලදී.

ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකවරයා සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසමින් සංදේශයේ අන්තර්ගත කරුණු නීතිපතිතුමාගේ අවධානයට යොමු කොට ඒ සම්බන්ධයෙන් එතුමාගේ මතය ලබා ගෙන 2013 විසර්ජන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරගැනීමට අවශ්‍ය නෛතික පසුබිම සකසා දීමට කටයුතු කරන ලදී.

4.5 රාජ්‍ය ව්‍යවසායයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව 2012-06-27 දිනැති තීරණය ක්‍රියාත්මක කිරීම:

ඉහත තීරණය (III වන ඇමුණුම) මඟින් ඉදිරියේදී අදාළ වාර්ෂික වාර්තා සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශය සමඟ පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතු බවට තීරණය කරන ලදී:

- ආයතනයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක්;
- විගණන විමසුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග; සහ
- ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශයක්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එකී තීරණය මඟින් දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ නොකරන සංදේශ නිවැරදි කිරීම් සඳහා අදාළ අමාත්‍යාංශ වෙත හරවා යවනු ලැබිණි. ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය හේතු කොටගෙන, රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ඇති බවට අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නිරීක්ෂණය කෙරිණි.

4.6 කොන්ත්‍රාත් පිරිවැය විචල්‍යතා ගැළපීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම පිළිබඳ 2012-07-04 දිනැති තීරණය ක්‍රියාත්මක කිරීම.

ඉහත තීරණය (**IV වන ඇමුණුම**) මඟින් ව්‍යාපෘතිවල සමස්ත පිරිවැය ඇස්තමේන්තු සංශෝධනවලට අදාළ විචල්‍යතා සමාලෝචනය කොට, අදාළ සමස්ත පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂා කිරීමෙන් පසුව, එවැනි සංශෝධන සඳහා සුදුසු නිර්දේශ අදාළ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කිරීම පිණිස පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවක් පත් කෙරිණි.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉහත තීරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ අතර, පිරිවැය විචල්‍ය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමේදී පළමු කොට පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ නිර්දේශ ලබා ගෙන තිබේ ද යන්න සැලකිල්ලට ගන්නා ලදී. එමඟින් 2012 වසර තුළ එම කරුණට අදාළ සංදේශ සම්බන්ධයෙන් වඩාත් ඉක්මනින් තීරණයන්ට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට හැකි විය.

4.7 2012 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් පාර්ශ්වකරුවකු ලෙස නම් කෙරුණු නඩු හා නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ ඉල්ලා සිටින ලද නඩු:

- 2012/158 මූලික අයිතිවාසිකම් පෙත්සම;
- 2012/331 මූලික අයිතිවාසිකම් පෙත්සම;
- 2012/572 මූලික අයිතිවාසිකම් පෙත්සම;
- 2012/718 මූලික අයිතිවාසිකම් පෙත්සම.

ඉහත නඩු සම්බන්ධයෙන්, කටයුතු කිරීමේදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධීකරණයක් හා සබඳතාවක් පවත්වා ගනු ලැබීය. රජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රජයේ ප්‍රධාන නීති උපදේශක වශයෙන් නීතිපති දෙපාර්තමේන්තුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලය සමඟ සමීපව කටයුතු කළේය. එහිදී නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් ඉන්දිකා දේමුණි ද සිල්වා මහත්මිය වැනි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දක්වන ලද උද්යෝගය ප්‍රශංසනීය බව සඳහන් කළ යුතුම වේ.

2012 වසර තුළ තීරණාත්මක නෛතික ගැටලු සම්බන්ධයෙන් හිටපු නීතිපතිවරයකු වන ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් මහතාගේ නීති උපදෙස් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට හැකියාව ලැබිණි. අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකවරයා වශයෙන් මොහාන් පීරිස් මහතා විසින් අගනා සේවයක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ලබා දෙන ලදී.

5. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරයේ සුවිශේෂත්වය නිසා බොහෝ අවස්ථාවලදී අනෙකුත් රජයේ ආයතනවල කටයුතු කෙරෙන සාමාන්‍ය ආකාරයෙන් බැහැරව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු වේ. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම් දෙකක් අතර කාල පරතරය සතියකට පමණක් සීමා වන බැවින්, පහත ආකාරයේ කල් දැමිය නොහැකි කාර්යභාරයන් රැසක් ඉතාම කෙටි කාලයක් තුළ ඉටු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරී ඇත.

- පසුගිය රැස්වීමේ වාර්තාව භාෂාත්‍රයෙන් පිළියෙල කිරීම.
- ඊළඟ රැස්වීමට නියමිත න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා යෝජිත අමාත්‍ය මණ්ඩල සංදේශවල අන්තර්ගත කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම.
- අවශ්‍ය අතිරේක තොරතුරු රැස් කිරීම හා එම කරුණුවලට අදාළව මීට පෙර අමාත්‍ය මණ්ඩල තීරණ කිසිවක් ගනු ලැබ ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු සොයා බැලීම.
- ඇතැම් සංදේශවල සඳහන් යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පැනනැඟිය හැකි ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා ගැන අධ්‍යයනය කිරීම. (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරින් විසින්)
- එම සංදේශවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන පරිදි ඒ ඒ අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන්ලා වෙතින් නිරීක්ෂණ ලබා ගැනීම.

මෙම සියලු කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන්, රහස්‍යභාවය ආරක්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමක් වන අතර, එය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින්, සතියේ දිනවල සාමාන්‍ය රාජකාරි වේලාවන් ඉක්මවා රාත්‍රී කාලයේ රාජකාරියේ නිරත වීමටත්, සති අන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදීමටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිලධාරින්ට සිදු වේ.

මෙම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල කාර්යාලයට නිලධාරින් බඳවා ගනු ලැබීමේදී විශේෂයෙන් තෝරාගත්, කුසලතා සහිත නිලධාරින් පිරිසක් බඳවාගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර, 2012 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයේ යෙදුණු නිලධාරින් පිළිබඳ තොරතුරු 6 වන පරිච්ඡේදයෙහි ඇතුළත් වේ.

විශේෂයෙන්ම භාෂා පරිවර්තක සේවයේ දකින්නට ලැබෙන පළපුරුදු භාෂා පරිවර්තකයින්ගේ හිඟය හේතු කොට ගෙන භාෂා පරිවර්තන කටයුතු සඳහා විශ්‍රාමික නිලධාරින් දෙදෙනෙකුගේ සේවය තවදුරටත් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු විය.

6. මානව සම්පත් කළමනාකරණය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලය තමන් සතු වටිනාම වත්කම ලෙස මානව සම්පත සලකයි. එනිසා, මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය අමාත්‍ය මණ්ඩල කාර්යාලයීය ප්‍රමුඛතා ලැයිස්තුවේ සුවිශේෂ ස්ථානයක් උසුළයි.

6.1 2012-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	13	10	03	-
තෘතියික මට්ටම	07	06	01	-
ද්විතියික මට්ටම	29	21	08	-
ප්‍රාථමික මට්ටම	28	24	04	
වෙනත් - භාෂා සම්බන්ධීකාරක	03	03	-	-
	80	**64**	**16**	-

6.2 2012-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය

	තනතුර	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු
01.	ලේකම්	01	01	-
	අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක	01	01	-
02.	අතිරේක ලේකම්	03	02	01
03.	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	04	02	02
04.	ගණකාධිකාරී	01	01	-
05.	සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ.)	02	02	-
06.	සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ. නොවන)	01	01	-
07.	සහකාර අධ්‍යක්ෂ II (තොරතුරු තාක්ෂණ)	01	01	-
08.	පරිපාලන නිලධාරී	01	01	-
09.	සම්බන්ධීකරණ ලේකම්	01	01	-
10.	භාෂා සම්බන්ධීකාරක	02	02	-
11.	භාෂා පරිවර්තක	05	04	01
12.	ප්‍රගති සහකාර	01	01 (වැ.බ)	01
13.	ලේඛන සහකාර	02	-	02
14.	රාජ්‍ය කළමනාකරණ සහකාර:	23	20	03
15.	සහකාර වැඩසටහන් සම්පාදක	01	-	01
16.	පුස්තකාලයාධිපති	01	-	01
17.	දත්ත සටහන් ක්‍රියාකරු	01	01	-
18.	පිළිගැනීමේ නිලධාරී	01	-	01
19.	රියැදුරු	12	11	01
20.	පණිවුඩකරු	01	01	-
21.	පොත් බැඳුම්කරු	01	01	-
22.	කා.සේ.සේ.	13	11	02
		80	**64**	**16**

6.3 2012 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්.

2012 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කරමින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු, සහකාර ලේකම්වරයකු, ගණකාධිකාරිනියක ඇතුළු නිලධාරීහු අට (08) දෙනෙක් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට එක් වූහ.

6.4 විශ්‍රාම ගැනීම

2012 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය කරමින් සිටියදී නිලධාරිහු තිදෙනෙක් (03) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත්හ. ඔවුහු වසර ගණනාවක් තම කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කරමින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත අගනා සේවයක් ලබා දුන්හ. එකී නිලධාරින්ගේ නම් පහත පරිදි වේ.

- එච්.විමලසේන මහතා (රියැදුරු) - 1992-03-01 - 2012-11-14
- එස්.ඩී.ආර්.ජයසේකර මහතා (රාජ්‍ය කළමනාකරණ සහකාර - ඉංග්‍රීසි යතුරු ලේඛක) - 1996-04-30 - 2012-07-17
- එස්.කන්දසාමි මහත්මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර - දෙමළ යතුරු ලේඛිකා) - 1997-09-03 - 2012-06-31

6.5 ස්ථාන මාරුවීම්

2012 වසර තුළ නිලධාරිහු සිව්දෙනෙක් (04) ස්ථාන මාරුවීම් ලබා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙනත් ස්ථාන කරා මාරුවී ගියහ.

6.6 පුහුණුව හා සංවර්ධනය

මානව සම්පත් කළමනාකරණයේදී පුහුණුව හා සංවර්ධනය වැදගත් භූමිකාවක් නිරූපණය කරයි. එය සේවකයකුගේ හෝ නිලධාරියකුගේ හෝ වර්තමාන රැකියා අවශ්‍යතා සපුරා ලීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා වැඩිදියුණු කිරීම කෙරෙහි පමණක් ඉලක්කගත වූවක් නොවන අතර අනාගත රැකියා අවශ්‍යතා පිළිබඳවද අවධානය යොමු කරයි.

මහජනතාවට වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය ආයතන තොරතුරු තාක්ෂණය (Information Technology) යොදා ගනිමින් කටයුතු කිරීමේ ප්‍රවණතාවක් ඇති බව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිරීක්ෂණයයි. එනිසා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම හා පුහුණුව රාජ්‍ය අංශයේ නියුතු නිලධාරින්ටද අත්‍යවශ්‍ය වූවක් බවට පත්ව ඇත. එය ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන්ද එකසේ අදාළ වන අතර ඉංග්‍රීසි භාෂාව සුහුරු ලෙස හසුරුවමින් වැඩ කිරීමට ඇති හැකියාව නොවැළැක්විය හැකි වර්තමාන රැකියා අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

පුහුණුව හා සංවර්ධනය මඟින් සේවකයකුගේ හෝ නිලධාරියකුගේ දැනුම, ආකල්ප සහ කුසලතා වැඩිදියුණු කිරීම පමණක් සිදු නොවන අතර එය සේවකයන්ගේ අභිප්‍රේරණයටද හේතු වේ.

2012 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සිය සේවක මහත්මමහත්මීන්ගේ ඉල්ලීම් සහ ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් විවිධ දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත. එසේ ලබා දුන් පුහුණු අවස්ථාවල විස්තර පහත පරිදි වේ.

දේශීය පුහුණුව:

නිලධාරියාගේ නම	පාඨමාලාව/පුහුණුවේ කාලසීමාව	පාඨමාලාවේ/පුහුණුවේ නම	පවත්වන ලද ආයතනය
එල්.පී.ජයම්පති මහතා	2012-03-05 - 2013-02-28	ප්‍රධාන නව්‍යකරණ නිලධාරින් (CIO) සඳහා වන ඉ-රාජ්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව.	කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PIM), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
සී.ජයසූරිය මහතා	2012-02-23 - 2012-04-07	ධාරිතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී.ලං.ප.සේ. I වන පන්තිය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
ඩබ්ලිව්.ඩී.සී.ඩී.දිසානායක මහත්මිය	2012-06-11 - 2012-06-13	රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
එන්.එම්.ආර්.පෙරේරා මහත්මිය	2012-03-12 - 2012-03-16	ධාරිතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී.ලං.ප.සේ. III වන පන්තිය - ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ මොඩියුලය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
	2012-03-05 - 2012-12-31	ප්‍රධාන නව්‍යකරණ නිලධාරින් (CIO) සඳහා වන ඉ-රාජ්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PIM), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
පී.බී.පුරනේගෙදර මහතා	2012-07-20 - 2012-10-05	ව්‍යාපාර සන්නිවේදන කුසලතා	බ්‍රිතාන්‍ය කවුන්සිලය
ආර්.කේ.කේ.සිරිවර්ධන මහතා	2012-03-05 - 2012-11-12	ප්‍රධාන නව්‍යකරණ නිලධාරින් (CIO) සඳහා වන ඉ-රාජ්‍යකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (PIM), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
වයි.ජී.පී.මාලනී ගමගේ මහත්මිය	2012-01-23	අත්තිකාරම් ගිණුම් පිළිබඳ පුහුණු පාඨමාලාව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය
පී.එස්.කේ.පෙරේරා මහත්මිය	2012-11-01 - 2012-11-02	විශ්‍රාම වැටුප් පිළිබඳ පුහුණු පාඨමාලාව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය

විදේශීය පුහුණුව

නිලධාරියාගේ නම	පාඨමාලාව/පුහුණුවේ කාලසීමාව	පාඨමාලාවේ/පුහුණුවේ නම	පවත්වන ලද ආයතනය
එල්.පී.ජයම්පති මහතා	2012-03-19 - 2012-03-30	ශ්‍රී ලං.ප.සේ. ජ්‍යෙෂ්ඨ නිලධාරින් සඳහා වන නායකත්ව සංවර්ධනය පිළිබඳ තුන්වන පුහුණු වැඩසටහන.	ඉන්දියාවේ පරිපාලන මාණ්ඩලික විද්‍යාලය (ASCI), හයිද්‍රාබාද්
ආර්.කේ.කේ.සිරිවර්ධන මහතා	2012-08-11 - 2012-08-13	13 වන වාර්ෂික ප්‍රධාන නව්‍යකරණ නිලධාරි සහ නායකත්ව සම්මන්ත්‍රණය	CTO සංසදය, ඉන්දියාව

7. මූල්‍ය සමාලෝචනය

7.1 ඇස්තමේන්තු:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2012 වර්ෂය සඳහා පුනරාවර්තන හා මූලධන වියදම් යටතේ මුළු ප්‍රතිපාදනයත් මුළු වියදමත් පහත පරිදි විය.

වියදමේ ස්වභාවය	මුළු ප්‍රතිපාදනය රු.	තථ්‍ය වියදම රු.	ප්‍රගතිය %	ඉතිරිය රු.
පුනරාවර්තන වියදම	62,720,000	54,445,637	87	8,274,363
මූලධන වියදම	20,930,000	6,980,866	33	13,949,134
මුළු එකතුව	**83,650,000**	**61,426,503**	**73**	**22,223,497**

අමාත්‍ය මණ්ඩල. කාර්යාලයේ 2012 වර්ෂයේ පුනරාවර්තන වියදමෙහි මූල්‍ය ප්‍රගතිය 87% ක් වූ අතර, 13% වන ප්‍රතිපාදන ඌන උපයෝජනය කෙරෙහි හේතු වූයේ, වැය විෂයය අංක 1405 යටතේ නීතිමය කටයුතු ඒකකය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන එම ඒකකය සඳහා සුදුසු නිලධාරින් හඳුනාගැනීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත පරිදි භාවිතයට නොගැනීමයි.

මූලධන වියදම්හි රුපියල් මිලියන 13.9 ක ඉතිරිවීම් කෙරෙහි හේතු වූයේ වර්තමාන කාර්යාල පරිශ්‍රය වෙනත් ස්ථානයකට ගෙන යනු ඇතැයි පූර්වානුමාන කරමින් අපේක්ෂා කළ පරිදි ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් හෝ නවීකරණ කටයුතු සිදු නොකිරීම සහ යෝජිත ලේඛනාරක්ෂක සහ කළමනාකරණ පද්ධති ව්‍යාපෘතියේ විෂයපථය පුළුල් කිරීම පිළිබඳව තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) හා වෙනත් අදාළ ආයතන විමසීමට සිදු වීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමයි.

7.2 නිලධාරින් සඳහා ණය අත්තිකාරම් ලබාදීම

2012 වර්ෂය තුළ මෙම කාර්යාලයේ නිලධාරීන් සඳහා අත්තිකාරම් "බී" ගිණුම යටතේ පහත සඳහන් පරිදි රු. 2,595,796/- ක ණය මුදල ලබා දී ඇත.

ලබාදුන් ණය වර්ගය	නිලධාරින් සංඛ්‍යාව	ණය මුදල් ප්‍රමාණය
ආපදා ණය	36	2,264,796
පාපැදි ණය	01	6,000
උත්සව අත්තිකාරම්	50	250,000
විශේෂ අත්තිකාරම්	30	75,000
ලබාදුන් මුළු ණය මුදල		2,595,796

7.3 ලී බඩු හා කාර්යාල උපකරණ මිල දී ගැනීම:

(i) සාකච්ඡා කාමරයේ අක්‍රියව තිබූ ඇමතුම් පද්ධතිය වෙනුවට නව ඇමතුම් පද්ධතියක් ස්ථාපිත කිරීම;

(ii) කාර්යාල ප්‍රදේශයට පමණක් සීමා වූ ජාල සම්බන්ධතා (LAN) දෙකක් (02) අලුතින් ස්ථාපිත කිරීම;

(iii) වානේ අල්මාරි 05ක්, පුස්තකාල වානේ අල්මාරි 02ක්, ලිපිගොනු රඳවන වානේ කැබිනෙට්ටු 01ක්, පරිගණක පුටු 05ක්, කාර්යාලයීය පුටු 06ක්, කාර්යාලයීය මේස 06ක් සහ පරිගණක මේස 02ක් මිල දී ගැනීම;

(iv) ඡායා පිටපත් යන්ත්‍රයක් (හෙවි ඩියුටි) මිල දී ගැනීම;

(v) පරිගණක 10ක් මිල දී ගැනීම;

(vi) මෝටර් සයිකල් 02ක් හා ත්‍රිරෝද රථයක් මිල දී ගැනීම;

(vii) කාර්යාලයීය පරිගණක සඳහා ප්‍රති වෛරස් මෘදුකාංගයක් මිල දී ගැනීම; සහ

(viii) ඡායා පිටපත් කඩදාසි මිල දී ගැනීම.

7.4 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම:

2012 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉදිරිපත් කළ යුතු වාර්ෂික විසර්ජන ගිණුම, (**VI වන ඇමුණුම**) අත්තිකාරම් "බී" ගිණුම (**VII වන ඇමුණුම**) විගණකාධිපතිවරයා වෙත යවා ඇත.

7.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම:

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2012 වර්ෂය සඳහා අවසන් කොට ඒ පිළිබඳ වාර්තාව විගණකාධිපතිවරයා වෙත යවා ඇත.

7.6 විගණන විමසුම්:

2012 වර්ෂය සඳහා විගණන විමසුම් පහක් (05) ලැබී ඇති අතර, ඒ සඳහා පැහැදිලි කිරීම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එම විගණන විමසුම්වල විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී ඇති ඇතැම් කරුණු සම්බන්ධයෙන් එකඟ නොවන බැවින් ඒ සම්බන්ධයෙන් වූ පැහැදිලි කිරීම් සවිස්තරව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එකී විමසුම් බොහෝමයකට පාදක වී ඇත්තේ මතභේදයට තුඩු දෙන ගෙවීම් කිසිවක් නොව ඇතැම් රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි කටයුතු කිරීම පිළිබඳවය. එකී අඩුපාඩු නිවැරදි කරගැනීමට දැනටමත් කටයුතු කර ඇති බව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත යැවූ පැහැදිලි කිරීම්වල දැක්වේ. (**VIII වන ඇමුණුම**)

11/1288/558/031

ගරු අග්‍රාමාත්‍යතුමා,
ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමන් හා
ගරු අමාත්‍යතුමන් වෙත.

අමාත්‍ය මණ්ඩලය වෙත
<u>සංදේශ ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ</u>

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන සංදේශ මැනවින් සකස් කෙරෙන බව තහවුරු කිරීම සඳහා, මේ කරුණ සම්බන්ධයෙන් 2010 මැයි මස 05 දින මවිසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට ඇතැම් සංශෝධන ද ඇතුළත් කර පහත දැක්වෙන පරිදි නැවත නිකුත් කිරීමට අදහස් කළෙමි.

01. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කළයුතු කරුණු:

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් හෝ කිසියම් පරිපාලන නියෝගයක් යටතේ වෙනත් බලධාරීන්/ආයතන වෙත පවරනු ලැබ ඇති විෂයයන් හැර, රජය වෙනුවෙන් ගතයුතු වැදගත් තීරණ සම්බන්ධයෙන් පමණි. මේ අනුව මූලික වශයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගතයුතු විෂයයන් වනුයේ;

(i) අයවැය කථාවට ඇතුළත් කිරීම මගින් අනුමැතිය ලද හෝ දැනටමත් අමාත්‍ය මණ්ඩල සංදේශයක ඇතුළත්වීම මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබ ඇති ප්‍රතිපත්තිමය කරුණු හැර, අනිකුත් වැදගත් ප්‍රතිපත්තිමය කරුණු.

(ii) ඉහත (i) හි සඳහන් පරිදි ප්‍රතිපත්තියක් වශයෙන් අනුමත කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී වැඩසටහන් හා ව්‍යාපෘති.

(iii) අලුතින් නීති සම්පාදනය කිරීම සඳහා හෝ පවත්නා නීතියක් සංශෝධනය කිරීම සඳහා හෝ අනුමැතිය ලබාගෙන ඒ සඳහා නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට හා දෙවනුව එසේ සකස් කළ කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට.

(iv) අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතුව ඇති, විෂයභාර අමාත්‍යවරයා විසින් යම් යම් පනත් යටතේ තමා වෙත පැවරී ඇති බලතල අනුව පනවන ලද නියෝග හා නිවේදන.

(v) රජය වෙනුවෙන් වෙනත් රාජ්‍යයන් සහ ජාත්‍යන්තර ආයතන සමග අත්සන් කෙරෙන සියලුම ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් (MOU).

(vi) එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006.10.05 දිනැති 6 වන අතිරේකයේ 2.14.1 යටතේ සඳහන් කර ඇති වටිනාකම් ඉක්මවන ටෙන්ඩර් ප්‍රදානය කිරීම.

(vii) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රජයේ ටෙන්ඩර් පටිපාටියේ II වන කොටසේ 232 වන මාර්ගෝපදේශය පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළයුතු සාකච්ඡා සම්මුති කමිටු පත්කිරීම.

(viii) ජාතියේ හිත පිණිස සුවිශේෂී අවස්ථාවලදී පමණක් මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රජයේ ටෙන්ඩර් පටිපාටි පිළිබඳ මාර්ගෝපදේශ - II වන කොටස ආදියෙහි දැක්වෙන විධිවිධාන වලින් බැහැරව කටයුතු කිරීම සඳහා අවසර ඉල්ලීම.

(ix) අයවැයෙන් වෙන්කරදී ඇති ප්‍රතිපාදන මාරු කිරීම මගින් වියදම් දැරීමට නොහැකි වූත්, ඊළඟ අයවැය තෙක් කල්දැමිය නොහැකි වූත්, හදිසි ස්වභාවයේ වියදම් දැරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

(x) වාර්ෂික විසර්ජන පනතේ දෙවන උපලේඛනයේ සඳහන් අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය කිරීම.

(xi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (දහ අටවන සංශෝධනයෙන් සංශෝධිත) 55(1) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සඳහා විධිවිධාන සැලසීම ද, එම කරුණු තීරණය කිරීම ද සඳහා අනුමැතිය ලබාදීම.

(xii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (දහ අටවන සංශෝධනයෙන් සංශෝධිත) 55(2) ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරෙන බලතල අනුව දිස්ත්‍රික් ලේකම්වරුන් ද ඇතුළුව, සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය කටයුතු සහ සේවයෙන් පහකිරීමට අදාළ කරුණු.

(xiii) රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් වාර්ෂික වාර්තා සහ ගිණුම් වාර්තා/කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම. (මීට අදාළව 2010 ජූලි මස 28 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරිපත් කළ යුතු වාර්තාවද සමග)

02. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළයුතු විෂයයන්:

(i) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුව හෝ මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, රාජ්‍යසේවා කොමිෂන් සභාවේ රීති, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ආදිය මගින් අමාත්‍ය මණ්ඩලය හැර වෙනත් බලධාරීන් වෙත පැවරී ඇති විෂයයන් සම්බන්ධයෙන් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් විෂයයන් ද ඇතුළුව).**

(ii) හුදෙක් ජාතියේ හිත පිණිස අත්‍යවශ්‍යම වන්නේ නම් මිස, රාජ්‍ය ව්‍යවසායයන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අධ්‍යක්ෂ මණ්ඩල විසින් වාණිජමය ශක්‍යතා පදනම් කරගෙන එළඹ ඇති තීරණවලට අනුකූල නොවන තීරණ ගැනීම සඳහා අනුමැතිය ඉල්ලීම්.

(iii) අධිකරණය හමුවේ විභාග වන නීති කෘත්‍යයකට අදාළ කරුණු සම්බන්ධයෙන් (කෙසේ වුවද, කිසියම් නීති කෘත්‍යයක් සමථයකට පත්කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමග එකඟතාවට එළඹීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වේ).

(iv) අධිකරණයේ නියෝගයක් ක්‍රියාත්මක කිරීම සඳහා (අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අවස්ථාවකදී එසේ කිරීමට බලාපොරොත්තු නොවන්නේ නම් පමණක්).

(v) සුවිශේෂී වෘත්තීමය/තාක්ෂණික/ශිල්පීය ක්ෂේත්‍ර සඳහා වුවද, අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිරව, මහා භාණ්ඩාගාරයේ පූර්ව එකඟතාව නොමැතිව උපදේශකවරුන්/ විචාර්යවරුන් පත්කිරීම.

(vi) අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව වෙනත් බලධාරීන්ට පවරා ඇති විෂයයන් සම්බන්ධයෙන්.

03. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම:

(i) ඉහත 01 හා 02 ඡේදවල සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගතයුතු විෂයයන් සම්බන්ධයෙන් පමණක් ගරු අමාත්‍යවරුන්ගේ උපදෙස් පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සිදුකළයුතු වේ.

(අ) **අමාත්‍ය මණ්ඩල සංදේශයේ අඩංගුවන යෝජනා පිළිබඳ වගකීම ගරු අමාත්‍යවරයා සතු වුවද, එහි සඳහන් කරුණුවල නිරවද්‍යතාවය පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා වගකිව යුතුවේ.** එබැවින් අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කෙරෙන ආවරණ ලිපිය, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කර නොමැති අවස්ථාවලදී, එම ලිපිය ලේකම්වරයාගේ අනු අත්සන සහිතව අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් අත්සන් කර තිබීම අවශ්‍ය වේ.

(ආ) **ඉදිරිපත් කරනු ලබන යෝජනා "මහින්ද චින්තන - ඉදිරි දැක්මෙහි" පුළුල් රාමුව හා ඒ අනුසාරයෙන් ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව සකස් කර ඇති සවිස්තර සැලසුම්වලට අනුකූල වියයුතු අතර, යෝජනා කරනු ලබන විසඳුම් ඉදිරිපත් කළ යුත්තේ අදාළ කරුණු සම්බන්ධ සියළුම තොරතුරු මැනවින් අධ්‍යයනය කිරීමෙන් පසුවය.**

(ඇ) සංදේශයෙන් ඉදිරිපත් කෙරෙන යෝජනාව වෙනත් අමාත්‍යාංශවලට සම්බන්ධ වන්නේ නම් හෝ බලපෑමක් ඇතිවන්නේ නම් එම අමාත්‍යාංශ සමග සාකච්ඡා කර පූර්ව එකඟතාවයට එළඹ තිබිය යුතුය. එබඳු අවස්ථාවන්හි අදාළ අමාත්‍යවරුන් එක්ව ඒකාබද්ධ සංදේශයක් ඉදිරිපත් කිරීම වඩාත් සුදුසුය.

(ඈ) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පතක් සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් ඉදිරිපත් කරන සංදේශයකට, අදාළ පනත් කෙටුම්පත භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ. එම පනත් කෙටුම්පතේ ඇතුළත් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි නොවන බවටද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනය මගින් පනවන ලද සීමාකිරීම් කිසිවකට යටත් නොවන බවට සහ පාර්ලිමේන්තුව විසින් නිත්‍යානුකූලව නීතිගත කළහැකි බවට ද ගරු නීතිපතිවරයා විසින් දෙනු ලබන සහතිකය අමුණා තිබිය යුතුය.

(ඉ) එසේම, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම පිණිස ඉදිරිපත් කළයුතු වන, විවිධ පනත් යටතේ සාදනු ලැබූ රෙගුලාසි සහ රජය විසින් අත්සන් කරනු ලබන ගිවිසුම් ආදිය සම්බන්ධයෙන් වන සංදේශ ඉදිරිපත් කළයුත්තේ, ඒවා නීති කෙටුම්පත් සම්පාදකගේ එකඟතාව සහ ගරු නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය.

(ඊ) ප්‍රසම්පාදන කටයුත්තක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන සංදේශයන්හි, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8 වන පරිච්ඡේදයේ නියමකර ඇති පරිදි, නියමිත කාලය තුළ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයට අභියාචනා ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය සියළුම අසාර්ථක ටෙන්ඩර්කරුවන්ට දන්වන ලද බවත්, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කිසිවක් ලැබී ඇති/නැති බවත්, විශේෂයෙන් සඳහන් කළයුතු වේ. ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයට අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී එම නිර්දේශය ගැන ද අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර එහි පිටපතක් ද ඇමිණිය යුතුය.

(උ) සංදේශයෙහි සඳහන් කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් මීට ඉහතදී සාකච්ඡාවට භාජනය කර ඇත්නම් එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය සහ රැස්වීමේ දිනය ද නව සංදේශයට ඇතුළත් කළ යුතුය.

(ඌ) අමාත්‍ය මණ්ඩලය විසින් වාර්තාවක් ඉල්ලීමෙන් අනතුරුව කිසියම් කරුණක් පිළිබඳව අළුතින් සංදේශයක ස්වරූපයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන විට මුල් සංදේශයෙහි සඳහන් කරුණු ද අළුතින් ඉදිරිපත් කෙරෙන සංදේශයේ කෙටියෙන් සඳහන් කළයුතුය.

(ii) **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ සහ අදාළ අනෙකුත් අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ නොමැතිව කිසියම් සංදේශයක් සම්බන්ධයෙන් තීරණ ගත නොහැකි බැවින්, එකී අමාත්‍යාංශ විසින් මනා අධ්‍යයනයකින් පසුව නිරීක්ෂණ ඉදිරිපත් කළහැකි වන පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශය කල්වේලා ඇතිව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට ද පිටපතක් සහිතව, අමාත්‍ය මණ්ඩල කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.**

(iii) අමාත්‍ය මණ්ඩල කාර්යාලයට ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ එම විෂයයට අදාළ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් වෙතොත් මුලින්ම ඒ වෙත යොමු කරනු ඇත. එම සංදේශ අමාත්‍ය මණ්ඩලයේ සාකච්ඡාවට ගනු ලබන්නේ අදාළ අනුකාරක සභාවේ නිර්දේශ සහිතව පමණි.

(iv) **සියළුම අමාත්‍ය මණ්ඩල සංදේශ භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.** එක් භාෂාවකින් සකස් කරන ලද දීර්ඝ ඇමුණුම් භාෂාත්‍රයෙන් සකස් කර ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාව සැළකිල්ලට ගෙන, ඇමුණුම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කිරීම මැනවි.

(අ) එකී සංදේශ සමග ඉදිරිපත් කෙරෙන ඇමුණුම් පහත සඳහන් ගණයට ඇතුළත් වන්නේ නම් එකී ඇමුණුම් භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

* පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙන නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත් හෝ කිසියම් ව්‍යවස්ථාවක අතුරු නියෝගයක් වශයෙන් පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන නියෝගයක්. (අදාළ අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදකට මග පෙන්වීමක් වශයෙන් සකස් කරනු ලබන ලේඛන හැර)

* අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව මහජනයාගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කෙරෙන ලේඛනයක්.

* ප්‍රසිද්ධ ලේඛනයක් වශයෙන් ප්‍රකාශයට පත් නොකළ ද, විවිධ මට්ටම්වල නිලධාරීන් විසින් පරිශීලනය කළ යුතු යම් යම් ක්ෂේත්‍රයන්ට අදාළව සකස් කෙරෙන ප්‍රතිපත්ති ප්‍රකාශයන් වැනි ලේඛන.

* අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කෙරෙන කෙටුම්පත් චක්‍රලේඛ.

* අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන ගිවිසුම්.

(ආ) විශාල පරිශ්‍රමයක් දරා භාෂාත්‍රයෙන් සකස් කළ යුතු ඇතැම් ලේඛන සීමිත පිරිසකගේ ප්‍රයෝජනය සඳහා පමණක් වන්නේ නම්, එබඳු අවස්ථාවක එම ලේඛනය භාෂාත්‍රයෙන් සැකසීමේ ප්‍රයෝජන සීමිත වනු ඇත. එසේ සකස් කිරීමට සැහෙන කාලයක් ගත වන බැවින් එම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමද පමාවීමට ඉඩ ඇත. එමෙන්ම අධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීමට ඉඩ ඇති බැවින් ටෙන්ඩර් ප්‍රදාන සම්බන්ධයෙන් වූ වාර්තා භාෂාත්‍රයෙන් සකස් කළවිට එකී අනුවාද අතර කිසියම් විෂමතාවක් තිබුණොත් එමගින් ව්‍යාකූල තත්ත්වයක් පැනනගී. මෙම කරුණු සැළකිල්ලට ගත් කල්හී ප්‍රසම්පාදන කමිටු වාර්තා හා තාක්ෂණ කමිටු වාර්තා එක් භාෂාවකින් (අදාළ නිලධාරි කමිටුව විසින් මුලින්ම සකස් කරන ලද භාෂා මාධ්‍යයෙන්) පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. එසේ වුවද එබඳු අවස්ථාවන්හිදි පහත දැක්වෙන අයුරින් කටයුතු කළ යුතු වේ:

(i) එකී ප්‍රසම්පාදන කමිටු වාර්තාවල හා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවල සඳහන් වැදගත් කරුණු අමාත්‍ය මණ්ඩල සංදේශයේ සංක්ෂිප්තව ඇතුළත් කිරීම.

(ii) එකී මූලික කරුණු අමාත්‍ය මණ්ඩල සංදේශයට ඇතුළත් කිරීම තුළින් අමාත්‍ය මණ්ඩල සංදේශය අවශ්‍ය ප්‍රමාණයට වඩා දීර්ඝ වන බව හැඟේනම් සංක්ෂිප්ත සටහනක් වශයෙන් භාෂාත්‍රයෙන් සකස් කොට අමාත්‍ය මණ්ඩල සංදේශයට අමුණා ඉදිරිපත් කිරීම.

(ඉහත (i), (ii) තත්ත්වයන් යටතේ වුවද අදාළ නිලධාරීන් විසින් අත්සන් කරන ලද ප්‍රසම්පාදන කමිටු වාර්තාව හා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව කුමන භාෂාවකින් හෝ සම්පූර්ණයෙන්ම අමුණා ඉදිරිපත් කළ යුතුය.)

(ඇ) අදාළ අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදකට මග පෙන්වීමක් වශයෙන් සකස් කර ඉදිරිපත් කරනු ලබන ලේඛන හා කෙටුම්පත් ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන ප්‍රතිපත්ති ප්‍රකාශනද භාෂාත්‍රයෙන් සකස් කිරීම වෙනුවට ඒවායේ අඩංගු මූලික කරුණු දැක්වෙන සාරාංශයක් භාෂාත්‍රයෙන් සකස් කර ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

(v) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරන්නේ කුමන කරුණක් සඳහා ද යන්න සංදේශයේ අවසාන ඡේදයේ නිශ්චිතව සඳහන් කළ යුතුය.

(vi) අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදි මෙකී මාර්ගෝපදේශ හා අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් විටින් විට නිකුත් කරනු ලබන උපදෙස් අනුගමනය කරන ලෙස ඔබේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට / ලේකම්වරියට උපදෙස් දීම මැනවි.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති.

2011 ජුනි මස 10 දින.

2012 වසරේ එක් එක් අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ

අ.ම. කාර්යාලය මගින් අමාත්‍යාංශයට දෙන ලද අංකය	අමාත්‍යාංශය	ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව
501	අතිගරු ජනාධිපතිතුමා	45
502	අග්‍රාමාත්‍යතුමා	07
503	රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය	137
504	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය	177
505	වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය	87
506	බුද්ධ ශාසන අමාත්‍යාංශය	21
507	ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය	17
508	වාරිමාර්ග අමාත්‍යාංශය	33
509	සෞඛ්‍ය අමාත්‍යාංශය	90
510	ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය	45
511	පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය	13
512	ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය	31
513	සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය	19
514	පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය	16
515	කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය	37
516	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	59
517	ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය	25
518	අධිකරණ අමාත්‍යාංශය	21
519	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	29
520	ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය	10
521	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	35
522	විදේශ කටයුතු අමාත්‍යාංශය	61
523	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	55
524	පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය	02
525	තැපැල් සේවා අමාත්‍යාංශය	09
526	තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	21
527	පරිසර අමාත්‍යාංශය	54
528	ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය	14
529	කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය	14
530	අධ්‍යාපන අමාත්‍යාංශය	53
531	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	23
532	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	14
533	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	14
534	සමාජ සේවා අමාත්‍යාංශය	19

535	පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය	07
536	කෘෂිකර්ම අමාත්‍යාංශය	55
537	ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය	27
538	ප්‍රවාහන අමාත්‍යාංශය	47
539	යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	37
540	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	11
541	පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	23
542	දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	16
543	සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	08
544	විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය	14
545	සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය	31
546	පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය	13
547	සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය	20
548	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	12
549	ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය	30
550	නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය	07
551	මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය	04
552	ක්‍රීඩා අමාත්‍යාංශය	08
553	රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය	36
554	විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය	03
555	ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය	13
556	ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය	04
557	රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	08
558	අමාත්‍ය මණ්ඩලයේ ලේකම්	51
	එකතුව	**1,792**

<u>රහසිගතයි.</u>

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
ජ්‍යෙ.අමා. සඳහා වන
ලේ.කාර්./සම-ප්‍ර.වි.නි.
විගණකාධිපති.

මගේ අංකය: 12/විවිධ (027)
2012 ජූලි මස 05 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

<u>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්.</u>

රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා
<u>ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම</u>

2012 ජුනි මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ඉ) වෙනත් කරුණු:

67. **රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම** - මෙම අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයේ අන්තර්ගත රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් පිළිබඳ කරුණු සාකච්ඡාවට ගනු ලැබූ අවස්ථාවේදී, 2010-07-28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ මෙම කරුණ සම්බන්ධයෙන් කර ඇති නියමයන්ට අනුකූලව ඇතැම් අමාත්‍යාංශ ක්‍රියා නොකරන බව අතිගරු ජනාධිපතිතුමා විසින් නිරීක්ෂණය කරන ලදී. එක් එක් ආයතනයට අදාළ විගණකාධිපති වාර්තාවල පෙන්වා දී ඇති අඩුලුහුඬුකම් විශ්ලේෂණය කිරීමේත් එම අඩුලුහුඬුකම් නිවැරදි කිරීම පිණිස අදාළ අමාත්‍යාංශය විසින් ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේත් අවශ්‍යතාව අතිගරු ජනාධිපතිතුමා විසින් අවධාරණය කරන ලදී. ඉදිරියේදී අදාළ වාර්ෂික වාර්තාව සලකාබැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශය සමග පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් ද ඉදිරිපත් කළයුතු බවට තීරණය කරන ලදී:

* ආයතනයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක්;
* විගණන විමසුම් හා විගණන වාර්තාවල සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගනුලැබූ ක්‍රියාමාර්ග; සහ
* ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශයක්.

→2.

අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ඉහත සඳහන් උපදෙස් තරයේ පිළිපැදීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතිගරු ජනාධිපතිතුමා, සිය විෂයපථය යටතේ ඇති රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේදී මෙකී උපදෙස්වලට අනුකූලවම ක්‍රියා කළයුතු බව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වා යැවීමට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට නියම කරන ලදී.

ක්‍රියා කළයුතු: **අමාත්‍ය මණ්ඩලයේ ලේකම්**
සියලුම අමාත්‍යාංශ

පිටපත්: **ජනාධිපති ලේකම්**
අග්‍රාමාත්‍ය ලේකම්
සම-ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා වන ලේකම් කාර්යාලය

IV වන ඇමුණුම

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජ්‍යෙ.අමා. සඳහා වන
ලේ.කාර්./සම-ප්‍ර.වි.නි.
අනෙ.සිය.අමා./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/0885/504/075
2012 ජූලි මස 12 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

කොන්ත්‍රාත් පිරිවැය විචල්‍යතා ගැලපීම් සඳහා
මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම

(මුදල් හා ක්‍රමසම්පාදන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-06-26 දිනැති සංදේශය)

2012 ජූලි මස 04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) **න්‍යාය පත්‍රයේ විෂයයන්:**

(I) **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:**

14. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0885/504/075 වූ, **"කොන්ත්‍රාත් පිරිවැය විචල්‍යතා ගැලපීම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම"** යන මැයෙන් මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-06-26 දිනැති සංදේශය - ප්‍රසම්පාදන කටයුතු සඳහා සූදානම් වීමට මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 5% ක උපරිමයක් ද, භෞතික අවිනිශ්චිත අවශ්‍යතා සඳහා 10% ක උපරිමයක් ද වශයෙන්, ව්‍යාපෘතියක සමස්ත පිරිවැය තුළ අවිනිශ්චිත ප්‍රතිපාදන ඇතුළත් කිරීම පිණිස වන විධිවිධාන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි සලසා තිබුණ ද, අමාත්‍යාංශ සහ අදාළ ආයතන විසින් විවිධ ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී, විෂය පථය වෙනස්වීම, අවශ්‍යතා නිවැරදි ලෙස ගණනය නොකිරීම, මිල ගණන් ඉහළයාම ආදී විවිධ හේතූන් මත ව්‍යාපෘතිවල සමස්ත පිරිවැය සීමාවන් ඉක්මවූ අවස්ථාවන් බොහොමයක් තිබූ බව අමාත්‍ය මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම තත්ත්වය වළක්වාගනු පිණිස, පහත සඳහන් පියවර ගැනීමට තීරණය කරන ලදී:

(i) ව්‍යාපෘතිවල සමස්ත පිරිවැය ඇස්තමේන්තු සංශෝධනවලට අදාළ විචල්‍යතා සමාලෝචනයකොට, අදාළ සමස්ත පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂා කිරීමෙන් පසුව, එවැනි සංශෝධන සඳහා සුදුසු නිර්දේශ අදාළ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවක් පත්කිරීම;

අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ඉහත සඳහන් උපදෙස් තරයේ පිළිපැදීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතිගරු ජනාධිපතිතුමා, සිය විෂයපථය යටතේ ඇති රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේදී මෙකී උපදෙස්වලට අනුකූලවම ක්‍රියා කළයුතු බව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වා යැවීමට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට නියම කරන ලදී.

ක්‍රියා කළයුතු: **අමාත්‍ය මණ්ඩලයේ ලේකම්**
සියලුම අමාත්‍යාංශ

පිටපත්: **ජනාධිපති ලේකම්**
අග්‍රාමාත්‍ය ලේකම්
සම-ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා වන ලේකම් කාර්යාලය

රහසිගතයි.

පිටපත්: ගරු නීතිපතිතුමා.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
ජොය.අමා. සඳහා වන
ලේ.කාර්./සම-ප්‍ර.වි.නි.
රා.පරි. හා ස්ව.ක./ලේ.
අනෙ.සිය.අමා./ලේ.
රාජ්‍ය සේවා කො.ස./ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/1534/558/041-I
2012 නොවැම්බර් මස 29 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය

ජනාධිපති ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව තිබූ, 2009-04-09 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ (එම කොමිෂන් සභාව වෙනුවෙන්) අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගයන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

(අමාත්‍ය මණ්ඩලයේ ලේකම් ඉදිරිපත් කළ 2012-10-30 දිනැති වාර්තාව)

2012 ඔක්තෝබර් මස 31 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් 2012 නොවැම්බර් මස 14 දින පැවැත්වුණු රැස්වීමේදී සංශෝධනය කරන ලදුව, එම සංශෝධිත තීරණය අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(අ) මූලික විෂයයන්:

03. (අ) 2012 ඔක්තෝබර් මස 31 වන බදාදා පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව, එහි විෂය අංක 32 හැර සහ පහත සඳහන් සංශෝධනයට යටත්ව, සම්මත කරන ලදී.

(i) **විෂය අංක 50** - මෙම විෂයට අදාළ කෙටුම්පත් තීරණය පහත දක්වා ඇති ආකාරයට කියැවෙන පරිදි සංශෝධනය කිරීමට තීරණය කරන ලදී:

"50. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/1534/558/041-I වූ **"රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව තිබූ, 2009-04-09 දින සිට 2011-05-12 දින දක්වා කාලය තුළ (එම කොමිෂන් සභාව වෙනුවෙන්) අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගයන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම"** යන මැයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම් ඉදිරිපත් කළ 2012-10-30 දිනැති වාර්තාව - (2012-10-18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය - විෂය අංක 41 ට අදාළ) ඉහත වාර්තාවේ අන්තර්ගත කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදුව, පරිපාලනමය සාධාරණත්වය තහවුරු කිරීම පිණිස පහත සඳහන් පරිදි ක්‍රියා කළයුතු බවට තීරණය කරන ලදී:

→ 2

(අ) පහත සඳහන් සුවිශේෂී හේතූන් යටතේ 2009-04-09 සිට 2011-05-12 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති සමය තුළ, එකී කොමිෂන් සභාව එසේ අක්‍රියව නොපැවතියේනම් එම කොමිෂන් සභාවේ විෂය පථය යටතට පත්විය හැකිව තිබූ විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ මගින් අතෘප්තියට පත් නිලධාරීන් විසින් පහත සඳහන් කරුණුවලට අදාළව එකී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති හෝ ඉදිරිපත් කරනු ලබන පෙත්සම් එම කොමිෂන් සභාව විසින් සලකා බැලීම යථායෝග්‍ය බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාර ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් සලකා අනුමත කිරීම:

(i) විධිමත් විනය පරීක්ෂණයේදී හෝ, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණ ගැනීමේ අවස්ථාවේදී හෝ අවධානය යොමුවිය යුතුව තිබූ, එහෙත් එසේ අවධානය යොමු නොවූ කිසියම් කරුණක් හෝ කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් ඉදිරිපත් කෙරෙන පෙත්සම්;

(ii) විධිමත් විනය පරීක්ෂණය ආරම්භයේ පටන් අදාළ විනය නියෝගය නිකුත් කිරීම දක්වා වූ ක්‍රියා පරිපාටියේදී චූදිත නිලධාරියාට යම් අගතියක් වන අන්දමේ ක්‍රියා පරිපාටික දෝෂයන් සිදුව ඇති බව පෙන්වා දෙමින් ඉදිරිපත් කෙරෙන පෙත්සම්;

(iii) අදාළ විනය බලධරයාගේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් දෙන ලද කිසියම් විනය නියෝගයක්, ඒ හා සමාන වරදක් සඳහා අතීතයේදී දී ඇති විනය නියෝගයක්/දඬුවමක් අභිබවා ගොස් ඇතැයි සඳහන් කරමින් ඉදිරිපත් කෙරෙන පෙත්සම්;

(ආ) ඉහත කී හේතු යටතේ ඉදිරිපත් කෙරෙන පෙත්සම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන කාලපරිච්ඡේදයක් ඇතුළත එකී කොමිෂන් සභාව විසින් භාර ගැනීම. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාලරාමුවක් ඇතුළත එම පෙත්සම් විභාග කොට සිය තීරණ අදාළ පරිපාලන බලධරයා සහ පෙත්සම්කරු වෙත දන්වා යැවීම.

→ 3

රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති කාලපරිච්ඡේදය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගයක් හේතුවෙන් අතෘප්තියට පත් රාජ්‍ය සේවකයකුට, තමන්ට එරෙහිව ලබාදී ඇති විනය නියෝග යළි සලකා බලන ලෙස ඉල්ලීමක් ප්‍රථමයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමටත්, එම කොමිෂන් සභාවේ තීරණයෙන් තෘප්තියට පත් නොවන්නේ නම් ඔහුට හෝ ඇයට එකී තීරණය ලැබීමෙන් සති හතරක (04) කාලසීමාවක් තුළදී පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කිරීමටත් අවස්ථාව සලසාදීම ඉහත කී වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය වන බව ද අමාත්‍ය මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී."

ක්‍රියා කළයුතු: **ජනාධිපති ලේකම්**
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

පිටපත්: **ගරු නීතිපතිතුමා**
අග්‍රාමාත්‍ය ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
සම-ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සඳහා වන ලේකම් කාර්යාලය
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
අනෙකුත් සියලුම අමාත්‍යාංශ
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

පරීක්ෂා කරන ලදී.
විගණන නිරීක්ෂණ අමුණා ඇත.
ඩී.ජී.එස්.ඒ -
ඒ එම්. ඩී. නයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.
දිනය: 2013.04.29

විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: 05 අමාත්‍යාංශයේ නම : අමාත්‍ය මණ්ඩල කාර්යාලය

වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහන් අංකය	වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම	(1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම	(2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම	(3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම	(4) මුළු ශුද්ධ වෙන්කිරීම (1+2+3)	(5) මුළු වියදම	(6) ඉතිරිය/ ඉක්මවීම (4-5)	පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 අංකයියට අනුව)
		රු.	රු.	රු.	රු.	රු.	රු.	
1	පුනරාවර්තන මෙහෙයුම් වැඩ සටහන	63,820,000		(1,100,000)	62,720,000	54,445,637	8,274,363	02
	උප එකතුව (පුනරාවර්තන)	63,820,000		(1,100,000)	62,720,000	54,445,637	8,274,363	
1	මූලධන මෙහෙයුම් වැඩ සටහන	19,000,000	830,000	1,100,000	20,930,000	6,980,866	13,949,134	02
	උප එකතුව (මූලධන)	19,000,000	830,000	1,100,000	20,930,000	6,980,866	13,949,134	
	මුළු එකතුව	82,820,000	830,000		83,650,000	61,426,503	22,223,497	

පිටු අංක 02 සිට 16 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 17 සිට 23 ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි
නම: එස්.අබේසිංහ
තනතුර: අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
දිනය: 2013.03.15
එස්. අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

ගණන්දීමේ නිළධාරි
නම:
තනතුර:
දිනය:

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම: ඩබ්ලිව්.ඩී.සී.ඩී.දිසානායක
තනතුර:
2013/03/15
ඩබ්.ඩී.සී.ඩී. දිසානායක
ගණකාධිකාරී
මාත්‍ය මණ්ඩල කාර්යාලය

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුම සැසඳුම් ප්‍රකාශය
2012 වර්ෂය

විෂයය අංකය 05011

	වියදමෙහි උපරිම සීමාව	ලැබීම්වල අවම සීමාව	හර ශේෂයේ උපරිම සීමාව
	රු. ශත	රු. ශත	රු .ශත
විසර්ජන පනතින් දෙනු ලැබූ සීමාවන්	2,600,000.00	2,000,000.00	11,000,000.00 *
වර්ෂය තුළ ප්‍රතිශෝධිත සීමාවන්	---	---	--- *
1 නියෝග අංක			
වර්ෂය අවසානයේ තත්‍ය අගයන්	2,595,796.00	2,736,077.04	10,930,987.26 *
(මු.රෙ .503 (1) ප්‍රකාර ගැලපුම් කළ පසු (සීමා නියමයන් පිළි නොපැදිම	-	-	-

02. රජයේ නිලධාරීන්ට ණය සහ අත්තිකාරම් පාලන ගිණුම

		දෙපාර්තමේන්තු පොත් අනුව	භාණ්ඩාගාරික පරිගණක වාර්තා අනුව
		රු. ශත	රු. ශත
වර්ෂය ආරම්භයේ ඉ/ගෙනා ශේෂය 2012.01.01		11,071,268.30	11,071,268.30
එකතු කළා වර්ෂය තුළ මුළු හර කිරිම්		4,381,533.00	4,501,533.00
(ඇමුණුම් අංක 01)			
අඩු කළා වර්ෂය තුළ මුළු බැර කිරිම්		4,160,938.04	4,280,938.04
(ඇමුණුම් අංක 01)			
වර්ෂය අවසානයේ ශේෂය		11,291,863.26	220,594.96

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY

විමසීම් අංකය } ජේපී/බී/සීබී/2012/01/04/21 ... 2013 ජනවාරි ০২ දින.

RECEIVED
07 JAN 2013
අමාත්‍ය මණ්ඩල කාර්යාලය

Addressed to ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙතයි

විෂයය :- ගෙවීම් වවුචර් හා ලිපිගොනු පරීක්ෂාව - 2012

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2012 වර්ෂයට අදාල ගෙවීම් වවුචර් හා ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

01. මුදල් රෙගුලාසි 264 (1) හි විධිවිධාන ප්‍රකාරව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත්, අවශ්‍ය විට නිසිපරිදි මුද්දර ගෙවූ කුවිතාන්සියකින් තහවුරු විය යුතු බව දක්වා ඇතත් එම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

02. 2008 ජනවාර් 01 දිනැති අංක 1530/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව රු. 25,000 ට වැඩි යම් මුදලක් හෝ වෙනත් දේපලක් සඳහා දෙන ලද ලදුපතක් සඳහා රු. 25.00 ක මුද්දර ගාස්තුවක් අයකල යුතු බව දැක්වුවද එසේ කටයුතු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.විස්තර ඇමුණුම 02 හි දැක්වේ.

03. මුදල් රෙගුලාසි 231 (1) හා (2) ප්‍රකාරව හැකිතාක් දුරට වෙනත් ලේඛණයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවනු පිණිස සෑම සේවයක් පිළිබඳවම සම්පූර්ණ විස්තර සියළුම වවුචර් වල අඩංගු විය යුතු මෙන්ම වවුචරයේ අමුණා ඇති ලියකියවිලි පිළිබඳ විස්තර දැක්විය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. කාර්යාලය විසින් ඉන්වොයිසිය නොමැතිව ඇස්තමේන්තුව පදනම් කරගෙන ගෙවීම් කළ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 03 හි දැක්වේ

04. මුදල් රෙගුලාසි 257 ප්‍රකාරව වවුචර්වලට ගෙවීම් කිරීම සඳහා ගෙවන නිලධාරියකු වෙත ඉදිරිපත් කිරීමට පෙර සියළුම වවුචර් සහතික කොට තිබිය යුතුය. එසේ වියදම් සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා ඇත්නම් එසේ ගෙවනු ලබන මුදල ඒ ගැන වගකිව යුතු නිලධාරියාගෙන් අයකර ගනු ලබන බවද මුදල් රෙගුලාසියේ වැඩිදුරටත් දක්වා ඇත.එසේ වියදම් සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 04 හි දැක්වේ.උක්ත ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

අංක 306/72, පොල්දූව පාර, , ශ්‍රී ලංකාව
Rje;jpu rJf;fk;> nfhOk;G 07> ,yq;if
No.306/72 Polduwa Road , SRI LANKA
දුරකථනය } 2691151
ෆැක්ස් අංකය } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් } oaggov@sltnet.lk

05. මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 දින ගත වන්නට ප්‍රථමයෙන් 208 (අ) පොදු ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද 2012 වර්ෂය සඳහා වූ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

06. මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව චෙක්පත් නිකුත් කර මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර 2012 සැප්තැම්බර් 31 දිනට එවැනි චෙක්පත් වල එකතුව රු. 80,689 කි.

07. මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළග මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතු නමුත් 2012 දෙසැම්බර් 05 දින වන විටත් 2012 ඔක්තෝබර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියා මාර්ග දින 07 ක් ඇතුලත දන්වන්නේ නම් කෘතඥ වෙමි.

කේ.ආර්. පෙරේරා
විගණන අධිකාරී
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

ඇමුණුම 01

වවුචර් අංකය	විස්තරය	ආයතනය	වටිනාකම රු.
08	WPKR 7399 මෝටර් රථයට රක්ෂණ ආවර්ණ ලබා ගැනීම	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්	82,769
15	ඉන්ධන සඳහා ගෙවීම	සී.එෆ්.ඩී.මෙල් ඇන්ඩ් සන්ස් ලිමිටඩ්	23,105
104	අමාත්‍ය මණ්ඩල කාර්යාල ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ලබාගත් ද්‍රව්‍ය සඳහා ගෙවීම	රීගල් පේන්ට් ඇන්ඩ් හාඩ්වෙයාර් ලිමිටඩ්	11,203
113	CRU -18890 ජායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම සඳහා ගෙවීම.	මෙට්‍රොපොලිටන් කමියුණිකේෂන්ස් ආයතනය	6,922
162	නායකත්ව පුහුණු වැඩමුළුව සඳහා අතිරේක ලේකම් L.P.ජයම්පති මහතාට ගුවන් ටිකට් පත් මිලට ගැනීම	ලේකම්, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය	38,760
169	සේවා ගිවිසුම් ප්‍රකාර කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් ගෙවීම	රොබින්සන් වර්ල්ඩ් වයිට් ආයතනය	44,833
190	විදුලි අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම	ඇටිකා ඉලෙක්ට්‍රිකල්ස් ලිමිටඩ්	8,440
193	GC-4843 වාහනය සේවා කිරීම	සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය	12,460
201	ට්‍රැෆික් කෝනර් 20 ක් මිලට ගැනීම	සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව	24,800

ඇමුණුම . 02

වවුචර් අංකය	විස්තරය	ආයතනය	වටිනාකම රු.
68*3	නිලවාහන වෙනුවට මාසික ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනා ගෙවීම	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සී. වීරසූරිය මහතා	49,180
68*4	-එම-	අතිරේක ලේකම් L.P.ජයම්පති මහතා	53,290
68*5	-එම-	අතිරේක ලේකම් W.M.C.J.ප්‍රනාන්දු මහතා	53,290
68*7	ඕස්ට්‍රේලියානු විදේශ ගමන් සදහා ගුවන් ටිකට් පත් වෙනස ගෙවීම	ජ්‍යෙෂ්ඨ නීති උපදේශක පි.එම්.එම්.පීරිස් මහතා	38,196
89	වායුසමීකණ යන්ත්‍ර බිදවැටීම් යථාවත් කිරීම වෙනුවෙන් ගෙවීම	ලංකා විදුලිබල මණ්ඩලය	207,066
91	සේවා ගිවිසුම් ප්‍රකාර කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් ගෙවීම	රොබින්සන් වර්ල්ඩ් වයිඩ් ආයතනය	44,833
100*3	ආපදා ණය ශේෂය ගෙවීම	කේ.කේ.සිරිවර්ධන මහතා	80,600
169	සේවා ගිවිසුම් ප්‍රකාර කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් ගෙවීම	රොබින්සන් වර්ල්ඩ් වයිඩ් ආයතනය	44,833
189	ඡායා පිටපත් කඩදාසි මිලට ගැනීම	ඒ.පි.එන්ටර්ප්‍රයිසස්	46,499

ඇමුණුම 03

වවුචර් අංකය	විස්තරය	ආයතනය	වටිනාකම රු.
09*5	රාත්‍රි සේවයේ නියුතු කාර්යමණ්ඩලයට ආහාර ලබාදීම සදහා අත්තිකාරම් මත බිල්පත් පියවීම	N.T.A.D.ඩයස්	10,000
135	අංක KS - 2455 වාහනය කාපට් කිරීම සදහා	රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් ලිමිටඩ්	6,345
139	අංක KS - 2460 වාහනය කාපට් කිරීම සදහා	රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් ලිමිටඩ්	6,345
179	අංක WA-0431 වෑන් රථය පිරිසිදු කිරීම සදහා	බිලුම්පාර්ක් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්	5,950
183	අංක KH 2877 මෝටර් රථය සදහා බැටරියක් ලබා ගැනීම සදහා	බ්‍රවුන් ඇන්ඩ් කම්පැණි	7,085

ඇමුණුම . 04

වවුචර් අංකය	විස්තරය	ආයතනය	වටිනාකම රු.
60*1	W.A.D.J.මර්වින් මහතාගේ නිවාස දුරකථන බිල්පත් පියවීම	W.A.D.J.මර්වින් මහතා	1,571
66	රාත්‍රි සේවයේ නියුතු කාර්යමණ්ඩලයට ආහාර ලබාදීම සදහා අත්තිකාරම් මත බිල්පත් පියවීම	N.T.A.D.ඩයස් මහතා	13,360
67	රාත්‍රි සේවයේ නියුතු කාර්යමණ්ඩලයට ආහාර ලබාදීම සදහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම	N.T.A.D.ඩයස් මහතා	15,000
205	කාර්යමණ්ඩලයට තේ සැපයීම සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට අත්තිකාරම් ලබා ගැනීම	P.J.සපුගොඩ මහතා	6,770

ජේපි/බී/සිබී/2012/01/04/21 සිබී/ඒ/විගණන 2013 2013-01-

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

<u>ගෙවීම් වවුචර් හා ලිපිගොනු පරික්ෂාව - 2012</u>

උක්ත හිසින් යුතුව මෙම කාර්යාලය වෙත යොමු කරන ලද තොරතුරු විමසීම සම්බන්ධයෙන් එහි එක් එක් ඡේදයට අදාළ පැහැදිලි කිරීම් පහත දැක්වේ.

01 වන ඡේදය: විගණනය විසින් ඇමුණුම 01 හි දක්වා ඇති සියලුම ගෙවීම් සඳහා නිසිපරිදි මුද්දර ගාස්තු ගෙවූ කුවිතාන්සි ලැබී තිබුනද ඒවා නිසි පරිදි වවුචරයට අමුණා නොතිබීම හේතුවෙන් අසම්පූර්ණ වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් වී ඇත. අදාළ කුවිතාන්සි වව්චර්වලට අමුණා විගණනය පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර මින් ඉදිරියේදී සියලුම ගෙවීම් සඳහා නිසි පරිදි කුවිතාන්සි ලබා ගත යුතු බවත් එම කුවිතාන්සි ගෙවීම් වවුචරයටම අමුණා තැබීමට කටයුතු කරන ලෙසත් අදාළ නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී. මුද්දර ගාස්තු අය නොවී තිබූ අවස්ථාවන්හිදි එම ගාස්තු අයකර ඒවා නිවැරදි කරන ලදී.

02 වන ඡේදය: 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව රු. 25,000 ට වැඩි යම් මුදලක් හෝ වෙනත් දේපලක් සඳහා දෙන ලද ලදුපතක් සඳහා රු.25.00 ක මුද්දර ගාස්තුවක් අය කිරීමට අදාළ විමසීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් පහත දැක්වේ.

වවුචර් අංකය	පැහැදිලි කිරීම්
68 * 3 68* 4 68 * 5	ඇමුණුම 02 මගින් පෙන්වා ඇති වවුචර් අංක 68 * 3, 68 * 4, 68 * 5 මගින් ගෙවීම් කර ඇත්තේ ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා වෙනුවෙනි. එය වැටුපේ කොටසක් ලෙස කෙරෙන ගෙවීම් වන බැවින් වැටුප් ගෙවීමේදී නිසි මුද්දර ගාස්තු අයකර ඇති බව දන්වමි.
68 * 7	68 * 7 වවුචරය මගින් සිදුකර ඇත්තේ දරන ලද වියදම් ප්‍රතිපූරණයකි. නිලධාරියා විසින් නිසි අත්සන යොදා ඇති අතර මුද්දර ගාස්තු ගෙවීම අදාළ නොවේ.

89	89 වවුචරයෙන් වායු සමීකරණ යන්ත්‍ර බිඳවැටීම් යථාවත් කිරීම සඳහා විදුලිබල මණ්ඩලයට කරන ලද ගෙවීමකි. රිසිට් පත හා චෙක්පත ලද බවට ලිපිඅමුණා ඇත. විදුලිබල මණ්ඩලය විසින් මුද්දර බදු වෙනම ගෙවනු ලබන බැවින් විදුලිබල මණ්ඩලයෙන් නිකුත්කරනු ලබන රිසිට්පත්වලට මුද්දර ගාස්තු අදාළ නොවේ.
91 169	සේවා ගිවිසුම් ප්‍රකාරව කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් රොබින්සන් වර්ල්ඩ් වයිට් ආයතනයට කරන ලද ගෙවීමකි. මේ සඳහා අදාළ මුද්දර ගාස්තු අයකර නිවැරදි කරන ලදී.
100 * 3	ආපදා ණය මුදල් ගෙවීමකි. මුද්දර ගාස්තු අයකර නිවැරදි කරන ලදී.
189	ඡායා පිටපත් කඩදාසි මිලට ගැනීම සඳහා කරන ලද ගෙවීමකි. නිසි පරිදි මුද්දර ගාස්තු අයකර නිවැරදි කරන ලදී.

03 වන ඡේදය: මුදල් රෙගුලාසිවලින් කියවෙන පරිදි හැකි සෑම අවස්ථාවකදීම ගෙවීම තහවුරු වන සියලු ලියකියවිලි වවුචරයට අමුණා තැබීමට කටයුතු කළද ප්‍රායෝගිකව අපහසුවන අවස්ථාවලදී අදාළ ලියවිලි වෙනම ගොනුගත කර ඇත. ඇමුණුම 03 මගින් පෙන්වා ඇති ගෙවීම්වලට අදාළ පැහැදිලි කිරීම් පහත දැක්වේ.

වවුචර් අංකය	පැහැදිලි කිරීම්
9 * 5	රාත්‍රී සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට ආහාර ලබාදීම සඳහා පරිපාලන නිලධාරි වෙත නිකුත් කරන ලද අත්තිකාරමකි. ඒ සඳහා නිසි පියවීමේ වවුචරයක් අංක 26 ලෙස මුදල් පොතෙහි ඇතුළත්ව ඇත. එම වවුචරයට අදාළව සියලු බිල්පත් එයට යා කොට ඇති අතර විගණනය විසින් පෙන්වා දී ඇති ගෙවීම අත්තිකාරම් නිකුත් කිරීමක් බැවින් බිල්පත් ලබා ගැනීමක් අදාළ නොවේ.
135 139 179 187	135, 139, 179, 187 යන වවුචර් මගින් ගෙවා ඇති සියලුම ගෙවීම් සඳහා බිල්පත් හා කුවිතාන්සි ලැබී ඇති බව තහවුරු කරමි. හැකි සෑම අවස්ථාවකදීම අදාළ බිල්පත් හා කුවිතාන්සි වවුචරයට යා කොට තැබුවද (ඒවා නොඅලවා ස්ටේපල් කටුවකින් අමුණා තිබියදී) එයින් ගැලවී යන අවස්ථාවලදී හා පසුව බිල්පත් ඉදිරිපත් කරන අවස්ථාවලදී (සමහර ආයතන විසින් චෙක්පත නොමැතිව බඩු නිකුත් කරනු නොලැබේ)) එම බිල්පත් හා කුවිතාන්සි පසුව අමුණා තැබීමේ අටියෙන් ගොනු ගත කර තිබුණි. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාළ ලේඛන වවුචර්වලට ඇමිණීමට කටයුතු කර ඇත. එසේම මින් ඉදිරියට මු.රෙ.231(1) හා (2) ප්‍රකාරව කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

04 වන ඡේදය: විගණනය විසින් පෙන්වා දී ඇති ඇමුණුම 04 හි සඳහන් ගෙවීම් නිසි අනුමැතිය හා නිසි සහතික කිරීම්වලට ලක්වූ ගෙවීම් වේ. අදාළ අත්තිකාරම් ලේඛනයේ හා වැය ලෙජරයේ නිසි පරිදි ගෙවීම් ඇතුළත් කොට සහතික කොට ඇතත් වවුචරය මත අත්සන යෙදීම අහඹු ලෙස මගහැරී ගොස් ඇති අතර අදාළ නිලධාරීන් ලවා නැවත සහතික කර නිවැරදි කරන ලදී. එසේම මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් වැළැකෙන අයුරින් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී.

05 වන ඡේදය: විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාළ ලේඛන හා දෛනික ධාවන සටහන් ප්‍රමාද දෝෂයකින් නිසි පරිදි ඉදිරිපත් කිරීම සිදුවී නොමැති බැවින් මින් ඉදිරියට එවැනි ප්‍රමාදයන් සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදු කර නිසි පරිදි අදාළ ලේඛන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

06 වන ඡේදය: 2012 සැප්තැම්බර් 31 දිනට රු.80689/- ක් වටිනා කල් ඉකුත්වූ චෙක්පත් සටහන්ව ඇතත් 2012 ඔක්තෝබර් මස බැංකු සැසඳුමෙන් ඒවා නිවැරදි වී ඇත.

07 වන ඡේදය: බැංකු සැසඳුම් සකස් කිරීමේදී නිසි පරිදි ගැලපීම් සිදු නොවන අවස්ථාවලදී නැවත නැවත පරීක්ෂා කිරීමට සිදුවීමෙන්, විගණන නිලධාරීන් මෙම කාර්යාලයේ විගණන කටයුතු වල නිරතව සිටි කාලසීමාවේදී ඔක්තෝබර් මස සැසඳුම අවසන්ව නොතිබුණි. කෙසේ වෙතත් මේ වන විට දෙසැම්බර් දක්වා බැංකු සැසඳුම් සකස් කිරීම අවසන් කොට ඇත.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY

විමසීම් අංකය } පෙපී/බී/සීබී/2012/1/4/22 නිකුත් කරන දිනය } 2013 ජනවාරි 04 දින.

Addressed to ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙතටයි

විෂයය :- මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සඳහා ගෙවීම

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report

අමාත්‍ය මණ්ඩල කාර්යාලයට ජලයෙන් සිසිල් කරනු ලබන මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 23 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.2010 දෙසැම්බර් 31 දින වන විට ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු.9,249,783 ක මුදලක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

1. පහත සඳහන් පරිදි කොටස් වශයෙන් මුළු මුදල ගෙවා තිබුණි.

කොටස් ගෙවීම්	චෙක්පත් අංකය	දිනය	වටිනාකම රු.
1	977615	2008.11.07	2,200,000
2	000051	2009.12.31	5,506,087
3	000052	2009.12.31	366,956
4	000409	2010.07.26	65,528
5	235996	2010.12.31	780,863
රඳවා ගත් බදු	000410	2010.07.26	301,428
- එම -	235997	2010.12.31	28,921
			9,249,783

මේ අනුව 2009 දෙසැම්බර් 23 අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට වර්ෂයකට පෙර එනම් 2008 නොවැම්බර් 07 දින ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු. 2,200,000 ක් ගෙවා තිබුණු බව අනාවරණය විය.

අංක 306/72, පොල්දූව පාර, , ශ්‍රී ලංකාව
nfhOk;G 07> ,yq;if
No.306/72 Polduwa Road , SRI LANKA
දුරකථනය
ෆැක්ස් අංකය
ඉලෙක්ට්‍රොනික් තැපැල්

02. අ. මුදල් රෙගුලාසි 702 නියමය ප්‍රකාරව කොන්ත්‍රාත්තු පිළියෙල කොට හැකිතරම් ඉක්මණින් ඒවාට අත්සන් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර මෙම ගණුදෙනුවට අදාල කාර්යය නිමකිරීම සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් අතර එකඟ වූ කොන්දේසි හා නියමයන් අඩංගු නිත්‍යානුකූල ගිවිසුමක් හෝ නොතිබුණි.

ආ. මුදල් රෙගුලාසි 702(3) ප්‍රකාරව කොන්ත්‍රාත්තු පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

03. 2008 වර්ෂයේ සිට වර්ෂ තුනක් ඇතුලත (2008,2009,2010) භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් යොදාගනිමින් උක්ත කාර්ය සඳහා වූ මුළු මුදලම ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණද විගණනය සිදුකරන ලද 2012 දෙසැම්බර් 07 දින වන විටත් අදාල කාර්යය (මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සවිකිරීම) ආරම්භ වී නොතිබුණි.

තවදුරටත් නිරීක්ෂණය වූයේ 2011 මාර්තු 03 දිනැති ප්‍රධාන ඉංජිනේරු (වායු සමීකරණ හා ශීතකරණ) ඇමතූ අමාත්‍ය මණ්ඩල ලේකම් වරයාගේ ලිපියෙන් මුළු ගෙවීම කර ඇති හෙයින් වායු සමීකරණ පද්ධතිය නොපමාව ස්ථානගත කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන ලෙස ඉල්ලීමක් කර තිබුණු බවයි. 2012 මාර්තු 26 දින අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම් , පර්පාලන නිලධාරී හා ලංකා විදුලි බල මණ්ඩලයේ ඉංජිනේරු මහතෙකු සමඟ කරන ලද සාකච්ඡා සටහන අනුව මෙම කාර්යාලය වෙනත් ස්ථානයකට රැගෙන යාමට යෝජනා වී ඇති බැවින් උක්ත ජලයෙන් සිසිල් වන මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය ඉදිකිරීම නතර වී ඇති බව දක්වා තිබුණි.

04. 2012 ජුනි 18 දින අමාත්‍ය මණ්ඩල ලේකම් ඇතුළු නිලධාරීන් පස්දෙනෙකු ගේ හා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු (වායුසමීකරණ හා ශීතකරණ) ඇතුළු විදුලි අධිකාරීගේ සහභාගිත්වයෙන් පැවති නව වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම සහ සේවා හා නඩත්තු කටයුතු සම්බන්ධ සාකච්ඡා සටහනෙහි 01 ඡේදයෙන් ඒ සඳහා විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කළ රු. 4,482,080 ක ඇස්තමේන්තුව පිළිබඳව සලකා බැලීම , 1 (111) ඡේදය ප්‍රකාරව මේ දක්වා ගෙවා ඇති රු. 9,249,784 ක මුදලින් මෙම ඇස්තමේන්තුව අඩුකර ඉතිරිය නැවත ලබා ගැනීම පිළිබඳව කරුණු දක්වා තිබුණි.

05. මෙහිදී මුදල් රෙගුලාසි 703 (1) (අ) ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම යටතේ කොටස් වශයෙන් කෙරෙන ගෙවීම් හා අවසාන වශයෙන් කෙරෙන ගෙවීම් සඳහා වැඩය , සැපයුම හෝ සේවාව විධිමත් පරිදි අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා කරුණු දැක්වීම් හැකි ඉක්මණින් විගණන අංශය වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

කේ.ආර්. පෙරේරා
විගණන අධිකාරී
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

සීබී/ඒ/විගණන 2013 - 3 ජේපී/බී/සීබී/2012/1/4/22 2013-04- 08

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සඳහා ගෙවීම

උක්ත හිසින් යුතුව මෙම කාර්යාලය වෙත යොමුකරන ලද තොරතුරු විමසීම සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම් පහත දැක්වේ.

01 වන ඡේදය

විගණන නිරීක්ෂණ සමග එකඟවන අතර ඒ සඳහා පහත පරිදි කරුණු පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

(අ) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2000 වර්ෂයේදී ස්ථාපනය කරන ලද වායු සමීකරණ යන්ත්‍ර 18 ක් නඩත්තුව සඳහා වාර්ෂිකව අධික වියදම් දැරීමට සිදුවීමත් 2009 වර්ෂයේදී එම වියදම රු. 760,600/- ක් වීමත් එකී වියදම්වලට අමතරව වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියා කිරීමේදී දැරීමට සිදුවන අධික විදුලිබල පිරිවැය හා මුහුදට ආසන්න පිහිටීම නිසා ආශ්‍රිත පරිසරයේ පවතින ලවණ මිශ්‍ර වාතය නිසා වායු සමීකරණ යන්ත්‍ර දිරාපත්වීමෙන් සිදුවන හානිය ද ගැන අවධානය යොමු කරමින් මෙම කාර්යාල පරිශ්‍රය සඳහා මධ්‍යම වායු සිසිලන පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට තීරණය කරන ලදී. විශේෂයෙන්ම මෙම කාර්යාලය අධි ආරක්ෂක කලාපයක පිහිටුවා තිබීම නිසා පෞද්ගලික ආයතනවල සේවකයන්ට මෙම කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීම සඳහා අවසර ගැනීම ඉතා අපහසු බැවින් මෙම කාර්යය විදුලිබල මණ්ඩලයට පැවරීමටද තීරණය විය.

→ 2

(ආ) ඒ අනුව අදාළ සවිකිරීම්/සේවා සැපයීම් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් රු. 9,497,546/- ක ඇස්තමේන්තුවක් ලබා දෙන ලදී. (ඇමුණුම 01)

(ඇ) ඉහත (ආ) හි මූල්‍ය පිරිවැය දැරීම සඳහා මූලිකව 2008 වර්ෂය සඳහා ලැබුනු ප්‍රතිපාදන රු. 2,200,000/- මගින් අත්තිකාරමක් ලබා දීමත්, 2009 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන වලින් රු. 6,500,000/-ක් මේ සඳහා යොදවා ගැනීමටත් අවශ්‍යවන ඉතිරි ප්‍රතිපාදනයක් වේ නම් 2010 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මගින් ලබා දීමටත් මෙම වැඩ කොටස ඉහත ඇස්තමේන්තුව යටතේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලංකා විදුලි බල මණ්ඩලය ලවා සවිකර එම ආයතනය මගින් නඩත්තු කටයුතු කරගෙන යාමට අදාළ යෝජනාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

(ඇ) ඒ අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 09/2958/301/044 වූ "අමාත්‍ය මණ්ඩල කාර්යාලය පරිශ්‍රය සඳහා ජලයෙන් සිසිල් කරනු ලබන මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම" යන මැයෙන් ඉදිරිපත් කළ 2009-12-23 දිනැති සංදේශය සලකා බැලූ අමාත්‍ය මණ්ඩලය ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු. 9,500,000/- ක පිරිවැයකට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ එකී පද්ධතිය පිහිටුවීම සඳහා වන යෝජනාව අනුමතකර ඇත. (ඇමුණුම 02)

(ඉ) එසේවුවත්, පහත හේතූන් මත අදාළ තීරණය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමට සිදුවිය.

i. මෙම කාර්යාලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ලේ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශය කොළඹ නගරයෙන් බැහැර වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය ද ඉදිරියේ වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමට සිදුවන බැවින් යෝජිත මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සඳහා කරනු ලබන දිගු කාලීන ආයෝජනයෙන් උපරිම ප්‍රයෝජන ගත නොහැකිවීම.

→ 3.

ii. කාර්යාලයේ රාජකාරි ස්වභාවය අනුව සමහර නිලධාරින් රාජකාරි වේලාවෙන් බැහැරව හා සති අන්ත දිනවල ද රාජකාරියේ යොදවනු ලබන බැවින්, එම අවස්ථාවලදී ද සම්පූර්ණ මධ්‍යම වායු සමීකරණ පද්ධතියම ක්‍රියාත්මක කිරීමට සිදුවීම නිසා මෙම පද්ධතිය සවිකිරීමෙන් අපේක්ෂිත ආර්ථික වාසි ලබාගත නොහැකි වීම හා නිලධාරින් සේවය කරන අංශවලට පමණක් සීමාවන පරිදි වෙන වෙනම මෙම පද්ධතිය ක්‍රියා කිරීමේ හා නැවැත්වීමේ උපකරණ සවිකිරීම සඳහා සැලකියයුතු මුදලක් වැය කළ යුතුවීම;

(ඉ) මෙම තත්ත්වය තුළ උක්ත යෝජනාව තවදුරටත් ක්‍රියාත්මක කිරීම ඵලදායී නොවන බැවින් හා මෙම කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථානගත කරනතෙක් කාර්යාලීය කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා තවදුරටත් අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ ඇති වායු සමීකරණ යන්ත්‍ර 13 'ක් වෙනුවෙන් අලුතින් වායු සමීකරන යන්ත්‍ර සවිකිරීමට තීරණය කරන ලදුව, විදුලිබල මණ්ඩලය මගින් ඇස්තමේන්තු කැඳවීමට කටයුතු කරන ලදී.

(ඊ) ඒ අනුව, විදුලිබල මණ්ඩලය මගින් වායු සමීකරණ යන්ත්‍ර 13 ක් සවිකිරීමට අදාළව ඉදිරිපත් කර තිබූ රු. 4,482,080.72 ක ඇස්තමේන්තුවට පහත නියමයන්ට යටත්ව 2012-08-08 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම 03)

i. අංක 09/2958/301/044 හා 2009-12-23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කිරීම;

ii. දැනට ක්‍රියා කළ නොහැකි තත්ත්වයේ පවතින වායු සමීකරණ යන්ත්‍ර 13 ක් අලුතින් සවිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති රු. 4,482,080.72 ඇස්තමේන්තුව පිළි ගැනීමට හා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එම කාර්යය ලංකා විදුලිබල මණ්ඩලය වෙත පැවරීම;

iii. විදුලිබල මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින දැනටමත් ලබාදී ඇති රු. 9,500,000/- ක මුදලින් විදුලිබල මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සපයන ලද සේවා සඳහා ගෙවීම් කිරීමෙන් පසු ඉතිරිවන මුදල ආපසු මහා භාණ්ඩාගාරය වෙත ලබාදීම.

→ 4

02 වන ඡේදය

ඉහත 01 හි දක්වා ඇති කරුණු පැහැදිලි කිරීම් අනුව විගණන විමසුමේ 02 (අ) හා (ආ) අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවක් මතු නොවීය.

03 වන ඡේදය

ඉහත 01 හි දක්වා ඇති කරුණු පැහැදිලි කිරීම් මේ සඳහා ද අදාළ වේ.

04 වන ඡේදය

ඉහත 01 හි දක්වා ඇති කරුණු පැහැදිලි කිරීම් මේ සඳහා ද අදාළ වේ.

05 වන ඡේදය

ඒ අනුව උක්ත (අ) සිට (උ) දක්වා පෙන්වා දී ඇති කරුණු ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ වායු සමීකරණ පද්ධතිය සවි කිරීමට අදාළ කටයුතු මාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුව ඇති බවටත්, එම තත්ත්වය තුළ රාජ්‍ය දේපල හා මුදල් අරපිරිමැස්මෙන් හා ඵලදායි ලෙස යෙදවීමට කටයුතු කර ඇති බවත් පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඒ අනුව විගණනය විසින් දක්වා ඇති පරිදි, මුදල් රෙගුලාසි 703(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් වගකීම් පැහැර හැරීමක් සිදුකර නොමැති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY

විමසීම් අංකය } ජෙපී/බී/සීබී/2012 1/4/2

නිකුත් කරන දිනය } 2013 ජනවාරි 09 දින.

Addressed to ලේකම් ,අමාත්‍ය මණ්ඩල කාර්යාලය කොටුව

විෂයය :- මූල්‍ය විගණනය - 2012

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වනු මිස විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report

---

උක්ත විගණනයේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

01. 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරණ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව වූ 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා වූ සංයුක්ත සැලැස්ම හා ඒ මත පදනම්ව 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

02. භාණ්ඩාගාර චක්‍රලේඛ 842 ප්‍රකාර විධිමත් ලෙස පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කර නොතිබූ අතර , විධිමත් ලෙස පිළියෙල කිරීමට අවශ්‍ය මූලික කටයුතු පමණක් සිදුකර තිබුණි.

03. කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම

කාර්යාලය විගණනයට ඉදිරිපත් කරන ලද වාහන ලේඛණයට අනුව ආයතනය සතු වාහන සංඛ්‍යාව 14 ක් ලෙස දක්වා තිබූ අතර 2011 අප්‍රේල් 06 දිනැති අධ්‍යක්ෂ ජනරාල් අයවැය දෙපාර්තමේන්තුව අමතා ඇති සීබී/ඒ/බී/එන්වී/2011 ලිපියෙන් ඉහත සඳහන් ආකාරයට වාහන මිලදී ගැනීමට ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව කාර් 03 ක් ,වෑන් 02 ක් හා ඩබල් කැබ් 01 අපහරණය සඳහා පෙන්වා දී තිබූ අතර (නිෂ්පාදිත වර්ෂය අනුව වසර 10 ට වඩා පැරණි) ඒ වෙනුවට කාර් 03 ක් වෑන් 03 ක් හා වැඩි වූ කාර්ය මණ්ඩලය සඳහා (අතිරේක ලේකම් තනතුරු දෙක සඳහා) කාර් 02 ක් අවශ්‍ය තාවය ලෙස දක්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

අ. ජාතික අයවැය දෙපාර්තමේන්තු අංක BD/GPS /102/9/12 vol iii දරණ ලිපි 04 ක් මගින් පහත අංක හා වටිනාකම් සඳහන් මෝටර් රථ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර වාහන ලබාදීමේ අරමුණ ලෙස දක්වා ඇත්තේ නිල වාහන හිමිකම් ඇති නිලධාරීන් වෙත ලබාදෙන බව වුවද , විගණිත දින වූ 2012 දෙසැම්බර් 06 දින වන විටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මෙම වාහන වලින් 03 ක් සංචිත වාහන ලෙස දක්වා තිබූ අතර නිති නිලධාරී වෙත පමණක් KR 7399 දරණ වාහනය වෙන්කර දී තිබුණි.

අංක 306/72, පොල්දූව පාර , ශ්‍රී ලංකාව
Rje;jpu rJf;fk;> nfhOk;G 07> ,yq;if
No.306/72 Polduwa Road , SRI LANKA

දුරකථනය / Telephone } 2691151
ෆැක්ස් අංකය / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / E-mail. } oaggov@sltnet.lk

වාහන අංකය	වර්ගය	වටිනාකම රු.
KS - 2455	මෝටර් කාර්	4,850,000
KS - 2460	- එම -	4,850,000
KR 3722	- එම -	4,850,000
KR 7399	- එම -	6,750,000

ආ. 2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ අංක 150 හි 6 ඡේදය ප්‍රකාරව මෙම කල්බදු ලීසිං ක්‍රමය යටතේ මෝටර් රථ හතර සඳහා වූ උපරිම මිල මට්ටම් සීමාව වාහන 03 ක් සඳහා අමාත්‍යාංශ ලේකම් හෝ සමාන ධූරාවලි නිලධාරීන්ට හිමි රු. මිලියන 5 සීමාවට ආසන්න රු. මිලියන 4.85 ක් වූ අතර ඉතිරි වාහනය (KR 7399) රු. මිලියන 6.75 ක් වූ අතර එය එම සීමාවද ඉක්මවා තිබුණි.එසේ වුවද මෙම වාහනය වෙන්කර දී තිබුණේ නීති උපදේශක වරයා වෙත බව තව දුරටත් නිරීක්ෂණය විය.

4. කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට වූ ඉල්ලීමේ දී පවතින වාහන සංඛ්‍යාව වැඩිකිරීමට හේතුව ලෙස දක්වා තිබුණේ 2011 වර්ෂයේ සිට අතිරේක ලේකම් තනතුරක් හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරක් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත බඳවා ගැනීම හේතුවෙන් නිලවාහන හිමිකම් ඇති නිලධාරීන් වැඩිවීමයි. කෙසේ වුවද නිලවාහන වෙන්කර දී ඇත්තේ ලේකම් , සම්බන්ධීකරණ ලේකම් හා නීති නිලධාරී වෙත පමණක් වන අතර අතිරේක ලේකම්වරු තිදෙනා හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ප්‍රවාහන දීමනා ලබා ගන්නා බව තවදුරටත් නිරීක්ෂණය විය.

5. වාහන ලොග් පොත් පරීක්ෂාවේදී පහත සඳහන් වාහන සඳහා ලොග් පොත් විගණනයට ඉදිරිපත් කර තිබුණද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විගණනයට ලබාදුන් වාහන ලැයිස්තුවේ හා පොදු 44 ආකෘතිය යටතේ නඩත්තු කර තිබූ බඩු වට්ටෝරු පොතේ 205-9763 දරන වාහනය පිළිබඳ සටහන් කිසිවක් නොවීය.

6. හානි හා පාඩු

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ඇ. පොදු 44 වැනි ආකෘතියේ බඩු වට්ටෝරු පොත 2010 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඉදිරියට ගෙන ආ ශේෂය මත පදනම්ව 2011 ජනවාර 01 දින සිට සකස් කර තිබුණි. (පැරණි බඩු වට්ටෝරු පොතෙහි ශේෂ පදනම් කර ගෙන නොතිබුණ) 2012 මාර්තු 29 දින ඉදිරිපත් කර තිබූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ අතිරික්ත හා ඌණතා කිසිවක් නොවිණි. කෙසේ වුවද බඩු වට්ටෝරු පොත සමීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂාවට ලක් වූ බවක් විගණනයේදී අනාවරණය නොවූ අතර සමීක්ෂණයෙන් පසු සමීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂාකර ඉදිරියට ගෙන ආ ශේෂයන් අදාල ලේඛණයේ ඇතුලත් නොවිණි.

ආ. බඩු වට්ටෝරු පොතෙහි නිකුත් කිරීම් අදාල පිටුවේ සටහන් තබනු වෙනුවට ලැබීම් පැත්තේ ශේෂයෙන් නිකුත් කිරීම් අඩුකර දක්වා තිබුණි.

ඇ. 2012 මාර්තු 29 දිනැති සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් අයිතම 59 ක් හදුනාගෙන ඇති අතර 2012 සැප්තැම්බර් 18 දිනැති සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ඒ සඳහා ලබාදී තිබුණි. (විකිණීම,වෙන්දේසි කිරීම,විනාශ කිරීම,අළුත්වැඩියා කිරීම සඳහා)2012 ඔක්තෝබර් 24 දිනැති ලිපියෙන් අදාල පාර්ශ්වයට ගත නොහැකි භාණ්ඩ මිල තක්සේරු කිරීම සඳහා මණ්ඩලයක් පත්කර තිබුණි. විගණනය සිදුකල 2012 දෙසැම්බර් 09 දින දක්වා අදාල අපහරණ කටයුතු සිදුකර නොතිබූ අතර පොත්වලින් ඉවත්කිරීමක්ද සිදුවී නොතිබුණි. 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 හි 6 ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරවනු කැමැත්තෙමි.

7. කාර්ය සාධන අගැයීම

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අරමුණ වනුයේ අමාත්‍ය මණ්ඩලයට හා එහි අනුකාරක සභාවලට ඵලදායක කාර්යක්ෂම හා අපක්ෂපාතී සේවයක් සැලසීම වේ. මෙම අරමුණ ඉටුකර ගනු සඳහා සමාලෝචිත වර්ෂයේ වූ කාර්ය සධනය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක CB/SS//HOD/MISC හා 2012 දෙසැම්බර් 06 දිනැති ලිපියට අනුව පහත පරිදි වේ.

2012 නොවැම්බර් 30 දිනට ලැබී ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සංඛ්‍යාව	- 1649
එදිනට තිරණ ගෙන ඇති පත්‍රිකා සංඛ්‍යාව	- 1552
	97

කාර්ය සාධන ප්‍රගතිය 94% ක් වූ අතර ගනු ලැබූ තිරණ 1552 ක්‍රියාත්මක වීම පිළිබඳව පසුවිපරම් කර ඒ සඳහා වූ ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

8. මුදල් රෙගුලාසි 109 ප්‍රකාර අලාභ පොත්වලින් කපාහැරීම

අංක WP - KH 2877 හොන්ඩා ව්ව්ක් වර්ගයේ මෝටර් රථය මුල් පිරිවැය රු. 6,250,000 ක් වූ අතර 2011 ජුනි 27 දිනැති ප්‍රාරම්භක වාර්තාව මත එහි ප්‍රතිසම්පාදන අගය සේ අළුත්වැඩියා වියදම රු. 272,615 ක් වූ අතර මුදල් රෙගුලාසි 105 (1) යටතේ වටිනාකම රු.232,278 ක් විය. රක්ෂණයෙන් අයකර ගත හැකි අගය ඉහත අගය වන හෙයින් ශුද්ධ අලාභය රු. 40,337 ක් විය. මුදල් රෙගුලාසි 109 යටතේ අලාභය පොතෙන් කපාහැරීම සඳහා මු.රෙ. 108(1) හෝ මුදල් රෙගුලාසි 108(3) ප්‍රකාර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නියෝගය හෝ නිර්දේශය භාණ්ඩාගාරයේ ලේකම් විසින් අනුමත කල යුතු වුවද ඉහත අලාභය පොත්වලින් කපාහැරීම සඳහා අනුමැතිය අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් 2012 ජුනි 20 දින ලබා දී තිබුණි.

ඉහත සඳහන් කරුණු පිළිබඳ ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියා මාර්ග විගණන අංශය වෙත යොමු කරන්නේ නම් කෘතඥ වෙමි.

කේ.ආර්. පෙරේරා
විගණන අධිකාරී
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

සීබී/ඒ/විගණන 2003-ii　　ජේපී/බී/සීබී/2012/01/04/23　　2013-04-29

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

<u>මූල්‍ය විගණනය - 2012</u>

උක්ත හිසින් යුතුව මෙම කාර්යාලය වෙත යොමු කරන ලද තොරතුරු විමසීම සම්බන්ධයෙන් එහි එක් එක් ඡේදයට අදාළව ඉදිරිපත් කෙරෙන පැහැදිලි කිරීම් පහත දැක්වේ.

01. 2010 මාර්තු මස 10 වැනි දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව, 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 02 ක් සඳහා වූ සංයුක්ත සැලැස්ම හා ඒ මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බැව් කියවෙතත් මෙම කාර්යාලයට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය රජයේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ඉටු කරනු ලබන කාර්යභාරයෙන් වෙනස් වේ. එසේ හෙයින් නිශ්චිත කාලවකවානු සහිත සැලැස්මකට මෙම කාර්යාලයේ කටයුතු පරිවර්තනය කළ නොහැකි බැව් මීට පෙර අප වෙත යොමු කරන ලද ඔබගේ ජේඑන්/බී/ඕසී/එම්එන්ජී/2011 දරන 2012-06-15 දිනැති විමසුමට අදාළව මගේ අංක CB/A/විගණන-2012 හා 2012-07-16 දිනැති පිළිතුරෙන් පැහැදිලි කර දී ඇති බව කරුණාවෙන් සැලකුව මැනවි. සංයුක්ත සැලැස්ම අදාළ වනුයේ, සංවර්ධන ව්‍යාපෘති හෝ වැඩසටහන් වශයෙන් හෝ මහජනතාවට විවිධ සේවා සැපයීමක් වශයෙන් හෝ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතනවලට බව විශ්වාස කරමි.

02. ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමේ මූලික කටයුතු අවසන්කොට ඇත. 2012 වර්ෂයේ මිලදී ගත් සියලුම වත්කම් ලේඛනයට ඇතුළත්කොට ඇති අතර, අනිකුත් වත්කම් ද එම ලේඛනයට ඇතුළත් කර කඩිනමින් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.

03. කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම:

(අ) තොරතුරු විමසීමේ ලිපියේ සඳහන් කර ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපි 4 මගින් අප වෙත දන්වා ඇත්තේ කල්බදු ක්‍රමය යටතේ වාහන 4 ක් ලබාදිය හැකි බව විනා මෙම කාර්යාලය විසින් මෝටර් රථ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාදීම නොවේ. මෙම වාහන ලබා ගනු ලැබුවේ වාහන අනුයුක්ත කළයුතු නිලධාරීන් 4 දෙනෙකු වෙනුවෙන් වුවත් අතිරේක ලේකම්වරුන් දෙදෙනා හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු තම පෞද්ගලික වාහන භාවිතා කිරීමට අවසර ලබාගත් නිසා විගණන දිනය වන 2012-12-06 වන විට මාස 03 ක පමණ කාලයක් සංචිත වාහන වශයෙන් ඉන් මෝටර් රථ 03 ක් යොදාගෙන තිබූ බව සත්‍යයකි. එහෙත් දැනට එක් අතිරේක ලේකම්වරයකුට එක් වාහනයක් වෙන්කර දී ඇත. දැනට පුරප්පාඩු වී ඇති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරු අතුරින් එක් තනතුරක් සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ 2013-03-25 දිනැති ලිපිය අනුව ස්ථාන මාරුකර එවනු ලැබූ නිලධාරියකු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක ලෙස පත් කරනු ලැබ ඇති අතර, අංක KS-2455 මෝටර් රථය ඇයට අනුයුක්ත කර ඇත. එසේ පුරප්පාඩු වී ඇති අනෙක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර සඳහා නිලධාරියකු පත්වූ වහාම ඉතිරි මෝටර් රථය ද ඔහුට/ඇයට අනුයුක්ත කෙරෙනු ඇත.

(ආ) ඉහත (අ) හි පැහැදිලි කළ පරිදි මෙම වාහන මෙම කාර්යාලය විසින් මිලදී ගන්නා ලද වාහන නොවන අතර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන මෙම කාර්යාලය වෙත ලබාදී ඇති වාහන වේ. කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාදෙන ලෙස ඉදිරිපත් කළ මගේ ඉල්ලීමේ සඳහන් වනුයේ අපහරණය කළයුතු වාහන වෙනුවෙන් සහ වැඩිවූ අතිරේක ලේකම් තනතුර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර සඳහා වාහන ලබා දෙන ලෙසයි. එම ඉල්ලීම පරිදි භාණ්ඩාගාරය විසින් මෙම වාහන

ලබාදීමේදී අංක 150 දරන චක්‍රලේඛයේ සඳහන් සීමාවන් සැලකිල්ලට ගනු ලැබ ඇති බව විශ්වාස කරමි. තොරතුරු විමසීමේ ලිපියේ දක්වා තිබූ පරිදි අංක KR-7399 වාහනය වෙන්කර තිබූනේ නීති නිලධාරියාට නොව අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක වරයාට වන අතර එම තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ තනතුරක් වන එය අමාත්‍යාංශයක ලේකම් තනතුරකට සමාන මට්ටමේ තනතුරකි.

04. වාහන සංඛ්‍යාව වැඩි කිරීමට හේතු වූ කරුණු වශයෙන් තොරතුරු විමසුමේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වෙමි. ඉහත 3 (අ) යටතේ සඳහන් කළ කරුණු ද මීට අදාළ වේ. අලුතින් ඇති කරන ලද අතිරේක ලේකම් හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරු සඳහා පත්කරන ලද නිලධාරීන් දෙදෙනා නිල වාහන ඉල්ලුම් කරනු ඇතැයි අපේක්ෂාවෙන් කල්බදු ක්‍රමය යටතේ වාහන දෙකක් ඉල්ලුම් කළ ද ඔවුන් දෙදෙනා ඔවුන්ගේ පෞද්ගලික වාහන රාජකාරි කටයුතු සඳහා යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම හේතුවෙන් අදාළ වාහන 02 සංචිත වාහන වශයෙන් අනුයුක්ත කරන ලදී. තොරතුරු විමසුම් ලිපියේ සඳහන් පරිදි අතිරේක ලේකම්වරුන් තිදෙනෙකු ප්‍රවාහන දීමනා ලබා නොගත් අතර, ප්‍රවාහන දීමනා ලබාගත් අතිරේක ලේකම්වරුන් දෙදෙනාගෙන් එක් අතිරේක ලේකම්වරයකු පෞද්ගලික වාහනය භාවිතා කිරීම වෙනුවට නිල වාහනය භාවිතා කිරීමට නැවත ඉල්ලා සිටි අතර, ඒ අනුව අංක KS-2460 දරන වාහනය ඔහු වෙත අනුයුක්ත කර ඇත. එසේම අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්වරයාට රාජකාරි වේලාවෙන් පසුව රාත්‍රී කාලයේදීත්, සති අන්ත හා රජයේ නිවාඩු දිනවලත්, වෙනත් හදිසි අවස්ථාවලදීත් රාජකාරි කටයුතුවල යෙදීමට සිදුවන නිසාත් ඔහුට අනුයුක්ත කර තිබූ, 1994 නිෂ්පාදිත නිල වාහනය අපහරණය කළ නිසාත් අංක KR- 3722 දරන මෝටර් රථය ඔහුගේ නිල වාහනය ලෙස අනුයුක්ත කරනු ලැබ ඇත. මෙම කාර්යාලයේ භාවිතය සඳහා තවදුරටත් යොදා ගැනීම අනාර්ථික ලෙස හඳුනා ගනු ලැබූ වාහන 05 ක් 2012 වර්ෂයේ අපහරණය කරනු ලැබූ අතර එම වාහන මගින් ඉටු කරවා ගනු ලැබූ රාජකාරි කටයුතු සඳහා අංක KS-2455 දරන මෝටර් රථය සංචිත වාහනයක් ලෙස අනුයුක්ත කර තිබූ බවත් මේ වනවිට එය 03 (අ) යතේ දක්වා ඇති පරිදි අළුතින් මෙම කාර්යාලයට ස්ථාන මාරුවී පැමිණි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරිය වෙත අනුයුක්ත කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

05. 205-9763 දරන ත්‍රිරෝද රථය 2006 වර්ෂයේදී අපහරණය කර ඇති බැවින්, එය 2012 වර්ෂයේ වට්ටෝරු බඩු පොත්වලට අදාළ නොවේ.

06. හානි හා පාඩු:

(අ) 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ශේෂයට අනුව පොදු 44 වැනි ආකෘතියේ භාණ්ඩ වට්ටෝරු පොතක් මෙම කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලැබේ. 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා පත්කළ නිලධාරීන් විසින් ඌණතා හා අතිරික්තතා ඇති බවක් වාර්තා කර නැත. සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ වට්ටෝරු පොත පරීක්ෂා කරන ලද බවට එක් එක් පිටුවේ අත්සන යොදා තිබුන ද අවසන් පිටුවේ අත්සන් යොදා සහතික කර ඇති බව වාර්තා කරමි.

(ආ) බඩු වට්ටෝරු පොතේ නිකුත් කිරීම් අදාළ පිටුවේ නිවැරදිව සටහන් යොදා තිබූ අතර වැඩිමනත් ලෙස අවසන් ශේෂය ගැලපීමේදී වඩාත් පැහැදිලි වන පරිදි ලැබීම් පැත්තේ ද සටහන් කර ශේෂ ගලපා තිබුණි.

(ඇ) පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ මිල තක්සේරු කර විකිණීම සඳහා අදාළ මණ්ඩල පත්කර ඇති අතර, ඒ ඒ නිලධාරීන්ගේ කාර්ය බහුලතාවය මත එකී කටයුතු නිම කර ගැනීමේ කාල පමාවක් සිදුවී ඇත. කෙසේ වෙතත් අදාළ කටයුතු හැකි ඉක්මනින් නිම කරන ලෙස අදාළ නිලධාරීන් හට උපදෙස් දී ඇත. අපහරණය කිරීටම නිර්දේශිත භාණ්ඩ වට්ටෝරු පොත්වලට 2012-12-31 දිනට ගැලපීම්කොට ඇති බව වාර්තා කරමි.

07. කාර්යසාධන ඇගයීම:-

(i) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය අගැයීම සඳහා තොරතුරු විමසීමේ ලිපියේ සඳහන් කර ඇති දර්ශකය යොදා ගැනීම යෝග්‍ය නොවන බව විශ්වාස කරමි.

(ii) පසු විපරම් කිරීම:

අමාත්‍ය මණ්ඩල තීරණයන්ගෙන් බහුතරයක් අදාළ වනුයෙ
ටෙන්ඩර් ප්‍රදානය කිරීම්, පත්වීම් සහ ප්‍රතිපත්තිමය අනුමැතිය
ලබාදීම සම්බන්ධවයි. පත්වීම් හා ටෙන්ඩර් ප්‍රදානය කිරීම
සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය විසින් දැඩි උනන්දුවකින
ක්‍රියාත්මක වේ. අනෙකුත් තීරණවලින් ආර්ථික සංවර්ධන
ක්‍රියාවලියට අදාළ තීරණ සියල්ල මුදල් හා ක්‍රමසම්පාදන
අමාත්‍යාංශයේ අයවැය සහ විදේශාධාර පසු විපරම් කිරීමේ
දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කෙරේ. සුවිශේෂි වැදගත
කමින් යුතු හෝ පසු විපරම් කිරීම් තුලින් ක්‍රියාවලියන්හි හා ක්‍රියා
පටිපාටිවල අඩුපාඩු නිවැරදි කළහැකි බව පෙනීයන ඇතැම් තීරණ
පමණක් දැනට මෙම කාර්යාලය විසින් පසු විපරම් කෙරේ. ඒ
අනුව, අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීමේ
ප්‍රතිඵලයක් වශයෙන් ටෙන්ඩර් කැඳවීම් දෙකක් පිළිබඳව සිදුවූ
ප්‍රමාදයන් පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත
කිරීමෙන් පසුව ඒ පිළිබඳ වාර්තා කැඳවා අදාළ නිලධාරීන්ට එරෙහි
විරුද්ධව විනයානුකූල පියවර ගතයුතු බවට ද අමාත්‍ය මණ්ඩලය
විසින් තීරණය කෙරිණ. 2013 අයවැය යෝජනාවක් වශයෙන
පසුවිපරම් කිරීමේ කාර්යය වඩාත් තියුණු ලෙස කිරීමට
අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන අතර, එහිදී දැනට
වඩා පුළුල් පරාසයක් තුළ මෙම කටයුතු කෙරෙනු ඇත.

08. මුදල් රෙගුලාසි 109 ප්‍රකාර අලාභ පොත්වලින් කපා හැරීම.

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියකු වන
බැවින් 108(3) ප්‍රකාරව කටයුතු කිරීමේ අවශ්‍යතාවක් නොමැති බව සඳහන් කරනු
කැමැත්තෙමි.

ඔබේ විමසුම් ලිපියෙන් අපේක්ෂිත තොරතුරු ඉදිරිපත් කිරීමේදී සිදුවූ
ප්‍රමාදය ගැන ද කණගාටුව පළ කරමි.

එස්. අබේසිංහ,

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY

විමසීම් අංකය — පෙඑග්/බී/ සීබී/03 /2012/48

නිකුත් කරන දිනය — 2013 අප්‍රේල් 04 දින.

Addressed to — ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය — වෙතටයි

විෂයය — රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම - විෂය අංක 00501

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report

2013 මාර්තු 27 දින ඉදිරිපත් කරනු ලැබූ යථෝක්ත ගිණුම් ප්‍රකාශවල දැක්වෙන තොරතුරු පරීක්ෂාවේදී විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් ඉක්මවා නොමැති බවටත් වර්ෂය තුලදී සීමා ප්‍රතිශෝධනයක් සිදුකර නොමැති බවටත් සී.සී. 10 ණය ලේඛන ශේෂයන් සහ අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක සටහන්වල දැක්වෙන ශේෂයන් සමග සැසඳෙන බවටත් නිරීක්ෂණය විය.

පහත දැක්වෙන නිරීක්ෂණයන් ඔබගේ අවධානය සඳහා යොමු කරනු ලැබේ.

01 ණය ශේෂ ශීර්ෂ අතර නිරවුල් කිරීම්

2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 හි 1.1.3 , 1.1.4 , 1.1.5, 1.1.6 හා 1.1.7 ඡේදයන්ට අනුව වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් මාරු වී පැමිණ සේවයට වාර්තා කරන ලද නිලධාරියාගේ මාරුවීම ලබාදුන් දෙපාර්තමේන්තුවට අදාල ණය ශේෂය මාසික ගිණුම් සාරාංශය මගින් පියවීම කළ යුතු බව දක්වා ඇත. නමුත් ඉහත චක්‍රලේඛයට අනුව කටයුතු කර නොතිබූ බව පහත කරුණු මගින් නිරීක්ෂණය විය.

අ. 2012 ජනවාරි 05 දින ශ්‍රී ලංකා රේගුවේ සිට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට ස්ථාන මාරු වී පැමිණි ගණකාධිකාර ඩබ්ලිව්.ඩී.සී.ඩී. දිසානායක මියගේ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ගණකාධිකාරී සී. ජයසූරිය මහතාගේ පියවීමට ඇති පිළිවෙලින් රු. 501,483 ක් හා රු. 687,316 ක් වූ ණය ශේෂ නිරවුල් කර තිබුණේ 2012 මැයි මස මාසික ගිණුම් සාරාංශය මගිනි.එනම් ස්ථාන මාරු වී මාස 04 ක් ගත වූ පසුවය.

අංක 306/72, පොල්දූව පාර , ශ්‍රී ලංකාව
Rje;jpu rJf;fk;> nfhOk;G 07> ,yq;if
No.306/72 Polduwa Road , SRI LANKA
දුරකථනය / Telephone. 2691151
ෆැක්ස් අංකය / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / E-mail. oaggov@sltnet.lk

ආ. උක්ත චක්‍රලේඛයේ 1.1.6 ඡේදය අනුව ස්ථාන මාරු වී ගොස් මාස 02 ක් ඇතුලත ණය ශේෂ නොපියවන ලද්දේ නම් තුන්වන මාසයේදී අදාල ආයතනය දැනුවත්කොට මාරුව ලබාදුන් ආයතනය විසින් මාසික ගිණුම් සාරාංශය මගින් එම ණය ශේෂය අයකර ගත යුතුය.එසේ වුවද 2012 මාර්තු 27 දිනැති ලිපියෙන් විපක්ෂ නායක ලේකම් කාර්යාලයට ස්ථාන මාරුකර ඇති එන්.ජ්.එල්.යූ . එස්. බණ්ඩාර මහතාගේ රු. 185,650 ක ණය ශේෂය නිරවුල් කර තිබුණේ 2012 නොවැම්බර් මස මාසික ගිණුම් සාරාංශය මගිනි.

01 අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම

2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 හි 2 ජේදයට අනුව 2009 අයවැය යෝජනා මගින් වැඩි සේවක සංඛ්‍යාවක් සඳහා ණය ලබාදීමට හැකිවීම අරමුණු කරගනිමින් එක් නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කර ඇති අතර එහි 3 ජේදයට අනුව ආපදා ණය වශයෙන් නිලධාරියා ලබන මාස දහයක වැටුප හෝ 250,000 හෝ යන මුදල් දෙකෙන් අඩු මුදල ලබාදිය යුතු වුවද නිලධාරීන් දෙදෙනෙකුගේ 2012 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආපදා ණය ශේෂය රු. 250,000 ඉක්මවා තිබූ බව කේවල ශේෂ ලැයිස්තුව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

02. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සිට 2012 ජූලි 07 දින විපක්ෂ නායක ලේකම් කාර්යාලයට ස්ථාන මාරු වී පැමිණි රාජ්‍ය කළමනාකරණ සහකාර ආනන්ද ජයසිංහ මහතාගේ ණය ශේෂය රු. 332,172 ක් ලෙස අංක - සීබී/ඒසී/එච්ඕඑඩී/12 හා 2012 අගෝස්තු 07 දිනැති ලිපියෙන් විපක්ෂ නායක ලේකම් වෙත දන්වා තිබුණි. මෙම ශේෂය 2012 නොවැම්බර් මාසික ගිණුම් සාරාංශය මගින් නිරවුල් කර තිබුණි. එසේ වුවද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2012 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම පරීක්ෂාවේදී මෙම නිලධාරියාගෙන් අයවිය යුතු ශේෂය ලෙස රු. 3,686 ක් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

උක්ත නිරීක්ෂණ සඳහා ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් දන්වන මෙන් කාරුණිකව ඉල්ලමි.

(කේ.ආර්. පෙරේරා)
විගණන අධිකාරී
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

පිටපත :- රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ - මහා භාණ්ඩාගාරය

සීබී/ඒ/විගණන 2013 - 5 කේඑෆ්/බී/සීබී/03/2012/48 2013-05- 03

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම

විෂය අංක - 00501

උක්ත හිසින් යුතුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද ඔබගේ ඉහත අංක දරන 2013 අප්‍රේල් 04 දිනැති විගණන විමසුම හා බැඳේ.

01. **ණය ශේෂ ශීර්ෂ අතර නිරවුල් කිරීම:**

(අ) 2012 ජනවාරි මස පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ 2012 මැයි මස පියවීමට සිදුවුයේ එකී රාජකාරිවල නියුක්ත ගිණුම් අංශයේ නිලධාරියාට වර්ෂය ආරම්භයේ ගිණුම් පොත් පිළියෙල කිරීම, පෙර වර්ෂයේ ගිණුම් පොත් සැසඳීම, භාණ්ඩාගාර පරිගණක වාර්තා පරීක්ෂා කිරීම, අත්තිකාරම් ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික විසර්ජන ගිණුම විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම වැනි වර්ෂය ආරම්භයේ සිදු කළ යුතු අත්‍යවශ්‍ය රාජකාරිවල නියුක්ත වීමට සිදුවීම හේතුවෙනි. එසේම අප්‍රේල් මස වැටුප් සැකසීම මුල් සතිය තුළ සිදුවන බැවින්, එම මාසයද කාර්ය බහුල බැවින් අදාළ පියවීම් මැයි මස සිදුකර ඇත.

(ආ) එන්.ජී.එල්.යූ.එස්.බණ්ඩාර මහතා පාර්ලිමේන්තුවට ස්ථාන මාරු ලැබ ගොස් එහි විපක්ෂ නායක කාර්යාලයට අනුයුක්තව සිටි අතර, එම කාර්යාලයේ ගණකාධිකාරිවරයකු නොසිටීම නිසා ණය පියවා ගැනීම සඳහා අදාළ කටයුතු සිදුකර නොතිබුණි. පසුව මෙම කාර්යාලය විසින් අදාළ ණය ශේෂය මාරු කිරීමේ කටයුතු සිදු කරන ලදී.

02. **<u>අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම:</u>**

(අ) 2012 ජනවාරි මස මෙම කාර්යාලයට ස්ථාන මාරු ලැබ පැමිණි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සී.ජයසූරිය මහතාගේ සහ ගණකාධිකාරි ඩබ්ලිව්.ඩී.සී.දිසානායක මහත්මියගේ ණය ශේෂයන් මෙම කාර්යාලයට ස්ථාන මාරු ලැබ පැමිණෙන අවස්ථාවේ රු. 250,000/- ඉක්මවා තිබූ අතර, 2012 වර්ෂයේ දී කිසිදු නිලධාරියකුට රා.පරි. චක්‍රලේඛ අංක 30/2008 අනුව රු. 250,000/- ඉක්මවා යන පරිදි ණය ලබා දී නොමැත.

(ආ) 2012 නොවැම්බර් මස ණය පියවීමේදී අතපසුවීමකින් අත්හැරී තිබූ ණය ශේෂය රු. 3,686/- කි. එය 2013 මාර්තු මාසයේදී නිවැරදි කර ඇත. මගේ අංක CB/F/08/2012 දරණ හා 2013-03-21 දිනැති ලිපියෙන් ඔබ වෙත යොමු කරන ලද මූ.රෙ. 506(ඩී) ප්‍රකාර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය මගින් රු. 3,186.00 ක් පියවා ඇති බව දැනුම් දී ඇත. ඉතිරි රු. 500.00 ද ඇතුළුව රු. 3,686.00 ක සම්පූර්ණ මුදල 2013 මාර්තු 28 දිනැති අංක 170 දරණ වවුචරයෙන් පියවා ඇත. ඒ අනුව අදාළ ණය ශේෂය මුළුමනින්ම පියවී ඇත.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

8/4.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

RECEIVED 08 APR 2013

විගණන විමසුම්-AUDIT QUERY

විමසුම් අංකය } ජේපී/බී/සීබී/04/2012 /49

නිකුත් කරන දිනය } 2013 අප්‍රේල් 04 දින.

Addressed to ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙතටයි

විෂය ශීර්ෂ 05 විසර්ජන ගිණුම - 2012

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report

2012 වර්ෂයේ ශීර්ෂ 05 අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විසර්ජන ගිණුම සහ ඒ සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දක්වා ඇත.

01. ප්‍රතිපාදන වියදම හා ඉතිරිය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය මාරුකිරීම් හා පරිපූරක ඇස්තමේන්තු ගැලපූ පසු ශුද්ධ ප්‍රතිපාදනය,වියදම හා ඉතිරිය පහත සඳහන් පරිදි විය.

වියදම් විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය රු.	මුළු වියදම රු.	ඉතිරිය රු.	ඉතිරියේ ප්‍රතිශතය %
පුනරාවර්තන	62,720,000	54,445,637	8,274,363	13
මූලධන	20,930,000	6,980,866	13,949,134	67
එකතුව	83,650,000	61,426,503	22,223,497	

2011 දෙසැම්බර් 30 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 155 ප්‍රකාරව පුනරාවර්තන වියදම් වලින් 2% ක් හා මූලධන වියදම් වලින් 9% ක් රාජ්‍ය වියදම් කළමනාකරණ කිරීමේ අරමුණින් ඉතිරි කළ පසු 2012 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන වලින් 58% ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රයෝජනයට නොගෙන ඉතිරිවීම් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර , , ශ්‍රී ලංකාව | Rje;jpu rJf;fk;> nfhOk:G 07> .va:if | No.306/72 Polduwa Road , SRI LANKA

දුරකථනය Telephone } 2691151 | ෆැක්ස් අංකය Fax No } 2697451 | ඉලෙක්ට්‍රොනික් තැපැල් E-mail } oaggov@sltnet.lk

(ආ) ශුද්ධ ප්‍රතිපාදනයෙන් 5% ට වඩා වැඩි ඉතිරිවීම්

වැය විෂයයන් 07 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 27,100,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එම වැය විෂයයන්ට අදාල මුළු වියදම රු. 5,867,191 ක් විය. ඉතිරිවීම් ප්‍රමාණය රු. 21,232,809 ක්වූ අතර ඉතිරිවීම් ප්‍රමාණය 6% සිට 100% දක්වා පරාසයක් තුල පැවති බව නිරීක්ෂණය විය.

වැය විෂයය	මුළු ශුද්ධ ප්‍රතිපාදනය	මුළු වියදම	ඉතිරිය	ඉතිරියේ ප්‍රතිශතය
	රු.	රු.	රු.	%
5-1-1-1301	2,900,000	1,259,301	1,640,699	57
5-1-1-1303	200,000	188,410	11,590	6
5-1-1-1405	8,770,000	3,106,748	5,663,252	65
5-1-1-2001	5,000,000	310,446	4,689,554	94
5-1-1-2003	400,000	235,206	164,794	41
5-1-1-2101	830,000	767,080	62,920	8
5-1-1-2502	9,000,000	-	9,000,000	100
	27,100,000	5,867,191	21,232,809	

02. පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන

5-1-1-2101වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී පරිපූරක ඇස්තමේන්තු මහින් රු. 830,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එහි වියදම රු. 767,080 කි .මේ අනුව රු. 62,920 ක් එනම් ප්‍රතිපාදනයෙන් 8% ක් ඉතිරි වී තිබුණි.

03. ඉතිරිවීම් හේතු පැහැදිලි කිරීම

පහත සඳහන් පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන්ගේ ඉතිරිවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ හේතු ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

වැය විෂයය	ඉතිරිවීම් රු.	ඉතිරිවීම් සඳහා දක්වා තිබූ හේතු
5-1-1-1405	5,663,225	අපේක්ෂිත පරිදි මෙම ව්‍යාපෘතිය පූර්ණ වශයෙන් බල ගැන්වීමක් සිදු නොවීම
5-1-1-2001	4,689,554	විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිස්ථානගත කිරීමට සහ මෙම ගොඩනැගිල්ල ද ඇතුලත් වන පරිදි ජනාධිපති චතුරස්‍රය සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද යෝජනාව හේතුවෙන් මෙම කාර්යාල ගොඩනැගිල්ලට ප්‍රධාන අළුත්වැඩියාවන් සිදු නොකිරීම
5-1-1-2101	62,920	ත්‍රීරෝද රථවල මිල ගණන් බලාපොරොත්තු නොවූ අයුරින් උච්චාවචනය වීම හේතුවෙන් ඉතිරි වීම
5-1-1-2502	9,000,000	මෙම ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කිරීම හේතුවෙන් අදාල යෝජනාව පිළිබඳ කටයුතු අවසන් නොකල නිසා වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම

04. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 15 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

05. ගිණුම්කරණ අඩුපාඩු

2012 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩීජ්එස්ඒ 7 (1) හි වර්ෂය තුල පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශයේ KH 2877 වාහනයේ රිය අනතුරට අදාලව පොතෙන් කපා හල අගය රු. 40,337 ඇතුලත් කර නොතිබුණි. හානි හා පාඩු ලේඛනය හා මු.රෙ. 109 යටතේ අලාභයන් පොතෙන් කපා හැරීම් සඳහා ඉල්ලුම් පත්‍රය පරීක්ෂාවේදී මෙම අලාභය කපාහැර තිබූ බව නිරීක්ෂණය විය.

06. 2012 වර්ෂයේ විසර්ජන ගිණුමෙහි ඩීජ්එස්ඒ 6 (1) ආකෘතියේ මුලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර විචලතා පැහැදිලි කිරීම් ප්‍රකාශයෙහි දක්වා තිබූ ඉතිරිකිරීම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා නොසැසදුනි. විස්තර පහත දක්වා ඇත.

වැය විෂයය	ගිණුමෙහි දක්වා ඇති ඉතිරිවීම	භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ඉතිරිවීම
	රු.	රු.
5-1-1-2001	4,683,554	4,689,554
5-1-1-2003	164,798	164,794

07. විසර්ජන ගිණුමේ සටහන (1) හි ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ 2012 වර්ෂය තුල වැය විෂයය 2102 ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදීගැනීම් එකතුව රු. 5,268,824 ක් ලෙස දක්වා ඇතත් ස්ථාවර වත්කම් ලේඛණය තුලනය කළ විට එම ශේෂය රු. 5,088,582 ක් විය.

08. ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කිරීම

2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අයිඑ්අයි/2002/02 පරිගණක ,පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කල යුතු නමුත් මේ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

09.ස්ථාවර වත්කම් ලේඛණයක් නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා 2004 ඔක්තෝබර් 14 දිනැති අංක 174 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඇමුණුම 01 පරිදි 2012 වර්ෂයේ ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවේ වර්ෂය තුල එකතු කිරීම් පරීක්ෂා කිරීමක් නොහැකි විය.

ඉහත සඳහන් කරුණු පිළිබඳ ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියා මාර්ග දින 03 ක් ඇතුලත දන්වන්නේ නම් මැනවි.

කේ.ආර්. පෙරේරා
විගණන අධිකාරි
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට.

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2323730, 2389151
ඊමේල් / மின்னஞ்சல் / E-mail info@cabinetoffice.gov.lk
වෙබ් අඩවිය / வெப் தளம் / Web Site www.CabinetOffice.gov.lk

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

ජනරජ චතුරස්‍රය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
குடியரசுச் சதுக்கம், சேர் பாரோன் ஜயதிலக்க மாவத்தை, கொழும்பு 01. இலங்கை.
Republic Square, Sir Baron Jayathilaka, Mawatha, Colombo 01. Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. සීබී/ඒ/විගණන 2013-4
ඔබේ අංකය / உமது இல. / Your No. ජේපී/බී/සීබී/04/2012/49
දිනය / திகதி / Date 2013-04-17

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව.

<u>ශීර්ෂ 05 විසර්ජන ගිණුම - 2012</u>

උක්ත හිසින් යුතුව අප වෙත යොමු කරන ලද ඔබගේ සමාංක හා 2013-04-04 දිනැති තොරතුරු විමසීමට අදාළව පැහැදිලි කිරීම් පහත දක්වමි.

(01) <u>ප්‍රතිපාදන වියදම් හා ඉතිරිය:</u>

(අ)

(i) විගණනය පෙන්වාදී ඇති ගණනය කිරීම් හා එකඟ වෙමි. මූලධන ප්‍රතිපාදන 67% ක ඉතිරිවීම්වලින් 98% ක් ම නියෝජනය වන්නේ වැය විෂය අංක 2502 යටතේ වන වෙනත් මූලධන වියදම් - ආයෝජන වැය විෂයේ ඉතිරිය හා වැය විෂය අංක 2001 යටතේ ගොඩනැඟිලි සහ ඉදිකිරීම් වැය විෂයෙහි ඉතිරියයි. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ යෝජිත ලේඛන ආරක්ෂණ හා කළමනාකරණ පද්ධතිය (Document Archiving and Management System) සඳහා වැය විෂය අංක 2502 යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇත. මේ සඳහා වූ මුල් යෝජනාව ගැන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නිලධාරීන් සමග සාකච්ඡා කිරීමේදී ඉදිරිපත් වූ අදහස් අනුව දිගු කාලීන දැක්මක් සහිතව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු සඳහා නවීන තාක්ෂණය භාවිත කිරීමට හැකිවන පරිදි මෙම ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කිරීමට පසුව තීරණය විය. එබැවින් ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 2012 වර්ෂයේදී වැය කිරීමට අවස්ථාවක් නොතිබුණි. මේ වනවිට මෙම ව්‍යාපෘතියට අදාළව

ලේකම් / செயலாளர் / Secretary 2329620
අතිරේක ලේකම් / மேலதிகச் செயலாளர் / Additional Secretary 2325279, 2329621
පරිපාලන නිලධාරී / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer 3136199

පත්කරනු ලැබ ඇති තාක්ෂණ ඇගයීම් කමිටුව සිය කටයුතු අවසන් කරමින් සිටී.

(ii) මෙම කාර්යාලය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ලේ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශය කොළඹ නගරයෙන් බැහැරව වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අනුව මෙම කාර්යාලයද ඉදිරියේදී වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමට සිදුවන බැවින් වැය විෂය 2001 යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන වැය කොට කිරිමට සැලසුම්කර තිබූ කාර්යාලීය අළුත්වැඩියා කටයුතු අත්හිටවන ලදී. මෙම හේතුන් නිසා මූලධන වියදම්වල ප්‍රතිපාදන ඉතිරිවීම් නොවැලැක්විය හැකි හා අපේක්ෂා නොකරන ලද හේතුන් නිසා සිදුවී ඇති පෙන්වා දෙනු කැමැත්තෙමි.

(iii) රු. 62,720,000/- ක් වූ පුනරාවර්තන වියදම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 8,274,363/- ක් එනම් 13% ක ඉතිරිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ අමාත්‍ය මණ්ඩල කාර්යාලය යටතේවන උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ නීති කටයුතු අංශය සඳහා 1405 වැය විෂය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි වැය නොවීමයි. එම අංශය භාරව කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් හිටපු නීතිපතිතුමා පත් කර තිබූ අතර ඔහුට අවශ්‍යවන කාර්යාලයීය ඉඩකඩ අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙන් කර දීමට හැකියාවක් නොතිබූ බැවින් ඔහුගේ කාර්යාලය ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැඟිල්ලේ ස්ථාපිත කරන ලදී. එමෙන්ම ඔහුට සහායවන කාර්ය මණ්ඩලයද ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යය මණ්ඩලයෙන් සපයන ලදී. අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකවරයාට අතිරේකව නීති ක්ෂේත්‍රයේ තවත් විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගේද සේවය ලබා ගැනීමට තිබූ සැලසුමද ක්‍රියාත්මක නොවීය. එබැවින් එම අංශයේ එදිනෙදා සමාන්‍ය පරිපාලන වියදම් හැරුණු කොට අනෙක් වියදම් මෙම කාර්යාලයෙන් දැරීම සිදු නොවීම නිසා එම වැය විෂය යටතේ ප්‍රතිපාදන ඉතිරිවී ඇත.

(ආ) <u>ශුද්ධ ප්‍රතිපාදනය 5% ට වඩා වැඩි ඉතිරිවීම්:</u>

(i) 5-1-1-1301 – 57%

2012 වර්ෂයේ වාහන සඳහා පුනරාවර්තන වියදම් රු. 2, 900,000/- ක් දැරීමට අපේක්ෂා කළ ද මෙම කාර්යාලය සතුව තිබූ ලියාපදිංචි

අංක QC-7621 *(2012.02.02 දින)*, GW-6163 *(2012-08-21දින)*, 59-1464 *(2012-08-21දින)* හා 19-8517 *(2012-08-21දින)* දරන අධික ඉන්ධන දහනයක් සහිත පැරණි වාහන 04 ක් අපහරණය කිරීම හේතුවෙන් එම අපහරණය කරන ලද පැරණි වාහන වෙනුවෙන් දැරීමට සිදුවෙතැයි අපේක්ෂා කළ ඉන්ධන හා අලුත්වැඩියා සඳහා වූ වියදම් ඉතිරිවීමෙන් මෙම පුනරාවර්තන වියදම් ඉතිරිවීම සිදුවිය.

(ii) 5-1-1-1303 – 06%

ගොඩනැඟිලි නඩත්තු කිරීම් වෙනුවෙන් රු. 200,000/- ක ප්‍රතිපාදන වෙන් කරන ලද නමුත් විවෘත ටෙන්ඩර් පරිපාටිය ඔස්සේ අපේක්ෂිත වියදමට වඩා අඩු මිලට මිලදී ගැනීම් සිදු කිරීමට හැකි වීම ඉහත ඉතිරිවීමට හේතු වී තිබේ.

(iii) 5-1-1-1405 - 65%

ඉහත 01 (අ) (iii) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

(iv) 5-1-1-2001 - 94%

ඉහත 01 (අ) (ii) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

(v) 5-1-1-2003 - 41%

ඉහත 01 (ආ) (i) හි පැහැදිලිකර ඇති පරිදි 2012 වසරේදී මෙම කාර්යාලය සතුව තිබූ වාහන 04 ක් අපහරණය කිරීම හේතුවෙන් එම පැරණි වාහන සඳහා වැය වෙතැයි අපේක්ෂා කළ එන්ජින් අලුත්වැඩියාවන් ආදිය සිදු කිරීම අවශ්‍ය නොවූ බැවින් මෙම ප්‍රතිපාදන ඉතිරිය සිදුවී ඇත.

(vi) 5-1-1-2101 - 8%

කාර්යාලය සඳහා ත්‍රී රෝද රථයක් මිලදී ගැනීමට මෙම ප්‍රතිපාදන

වෙන් කර ගන්නා ලද අතර අදාළ මිලදී ගැනීම සිදුකරන අවස්ථාවේදී වෙළඳපොළ ත්‍රී රෝද රථවල මිල අඩුවීම හේතුකොට ගෙන මෙම ප්‍රතිපාදන ඉතිරිවීම සිදුවිය.

(vii) 5-1-1-2502 - 100%

ඉහත 01(අ) (i) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

02. <u>පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන:</u>

5-1-1-2101 වැය විෂය යටතේ ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනය රු.830,000/- කි. අදාළ මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද්දේ ඒ වනවිට වෙළඳපොලේ ත්‍රීරෝද රථ මිල ගණන් සැලකිල්ලට ගෙනය. කෙසේ නමුත්, අදාළ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත්කිරීමේ සිට ප්‍රසම්පාදන කමිටු තීරණය ගැනීම දක්වා අතර කාලයේදී වෙළඳපොලේ ත්‍රීරෝද රථ මිල ගණන් සැලකියයුතු ප්‍රතිශතයකින් අඩුවිය. ඒ අනුව ඇස්තමේන්තුගත කරන ලද වෙළඳපොල මිලට වඩා අඩු මිලට අදාළ ත්‍රීරෝද රථය මිලදී ගැනීමට අවස්ථාව ලැබුණු හෙයින් ඉහත ප්‍රතිපාදන ඉතිරිවීම නොවැලැක්විය හැකි කරුණක් බව පෙන්වා දෙමි.

03. <u>ඉතිරිවීම් සඳහා හේතු පැහැදිලි කිරීම:</u>

5-1-1-1405

ඉහත 01 (අ) (iii) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

5-1-1-2001

ඉහත 01 (අ) (ii) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

5-1-1-2101

ඉහත 02 ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

5-1-1-2502

ඉහත 01(අ) (i) ඡේදයේ දක්වා ඇති පැහැදිලි කිරීම මේ සඳහාද අදාළ වේ.

(04) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම:</u>

2012-12-12 දින සිට මේ සඳහා කටයුතු කිරීම අරඹා ඇත. මේ වනවිට අදාළ කමිටුව පත් කර සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදුකරගෙන යනු ලබන බැවින් එම කටයුතු අවසන් වූ වහාම අදාළ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

(05) <u>ගිණුම්කරණ අඩුපාඩු:</u>

විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. හානි පාඩු ලේඛනයේ කපාහැරීම් යටතේ ඇතුළත් විය යුතු නමුත් වැරදීමකින් මෙම රුපියල් 43,337/- ක අගය අයකිරීම් යටතේ සඳහන් කර ඇත. ඩීජීඑස්ඒ7(1) හි කපා හළ අගයන් යටතේ එය සඳහන් විය යුතුය.

(06) 5-1-1-2001

විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. දත්ත පරිගණකගත කිරීමේදී ඉහත දෝෂය සිදුවී තිබේ. කෙසේ වෙතත්, අපගේ වැය ලෙජරයේ අදාළ නිවැරදි අගය සටහන් වී තිබේ.

5-1-1-2003

විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. දත්ත පරිගණකගත කිරීමේදී ඉහත දෝෂය සිදුවී තිබේ. ඒ අනුව නිවැරදි කරන ලදී.

(07) විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. වැට් අගය රහිතව අදාළ ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම් එකතුව සඳහන් කිරීම හේතුවෙන් මෙම දෝෂය සිදුවී ඇත. ඒ අනුව, අදාළ ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කරන ලදී.

(08) <u>ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම:</u>

පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකළද පොදු ස්ථාවර වත්කම් ලේඛනයේ පරිගණක උපාංග සහ මෘදුකාංග පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව ඉදිරියේදී ඒ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට පියවර ගනු ලැබේ.

(09) 2012 වර්ෂයේ සිට ආරම්භ කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළකොට පවත්වාගෙන යනු ලැබේ. විගණන අවස්ථාවේදී එකතුකිරීමේ අගයන් පරීක්ෂා කිරීමට නොහැකි වූ බව සඳහන් කර ඇතත්, විගණන නිරීක්ෂණ 07 හි සඳහන් කරුණු අනුව ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන් අදාළ එකතුව ඔබේ නිලධාරීන් විසින් නිවැරදිවම පරීක්ෂාකර ඇති බව පැහැදිලි වේ. මෙම නිරීක්ෂණය සමග එකඟවිය නොහැකි බව කාරුණිකව සඳහන් කරනු කැමැත්තෙමි.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
MyNo } පේපී/බී/සීබී/එම්ඒඑන්ජ්/2012

ඔබේ අංකය
Your No

දිනය
Date } 2013 ජුනි 06 දින.

RECEIVED
2013 JUN
අමාත්‍ය මණ්ඩල කාර්යාලය

විසර්ජන ශිර්ෂය 05 _ අමාත්‍ය මණ්ඩල කාර්යාලය
කළමනාකරණ විගණන වාර්තාව -2012

1. මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ පාලනය මෙහෙයවීම පිණිස තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියළුම සහායයන් කාර්යක්ෂම ලෙස ලබා දීම .

(ආ) ප්‍රධාන කාර්යයන්

අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයට හා අනුකාරක සභාවන්ට කරුණු ඉදිරිපත් කිරීම , අමාත්‍ය මණ්ඩල තීරණ භාෂාත්‍රයෙන් සකස් කර අමාත්‍ය වරුන් වෙත හා අමාත්‍යාංශවලට නිකුත් කර ඒ පිළිබඳ පසුවිපරම් කිරීම.

2. ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් පිළියෙල කරනු ලබන ගිණුම් සහ ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

ගිණුමේ නම	ශීර්ෂ/ විෂය අංකය	2013 මාර්තු 31 දිනට ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම
විසර්ජන ගිණුම	05	ඉදිරිපත් කර ඇත
රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	00501	ඉදිරිපත් කර ඇත

අංක 306/72, පොල්දූව පාර ,
, ශ්‍රී ලංකාව
No.306/72 Polduwa Road ,
SRI LANKA
දුරකථනය
ෆැක්ස් අංකය

3. යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

3.1 සංයුක්ත සැලස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

3.2 වාර්ෂික ක්‍රියාකාර් සැලස්ම

ඉහත (3.1) සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට කාර්යාලය වාර්ෂික ක්‍රියාකාර සැලස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

3.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

3.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

4. ගිණුම්

4:1 විසර්ජන ගිණුම

(අ). මුළු ප්‍රතිපාදනය හා වියදම

වියදමේ ස්වභාවය	වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන	2012 දෙසැම්බර් 31 දිනට සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය	2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය වියදම	2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය
	රු.	රු.	රු	රු
පුනරාවර්තන	63,820,000	62,720,000	54,445,637	8,274,363
මූලධන	19,000,000	20,930,000	6,980,866	13,949,134
එකතුව	82,820,000	83,650,000	61,426,503	22,223,497

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

සලසා තිබුණු ප්‍රතිපාදනය පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.

		ප්‍රතිශතය
-	මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය	73%
-	මුළු ශුද්ධ මුලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස වැයකිරීම් ප්‍රමාණය	33%

(ආ) ප්‍රතිපාදන ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.9,000,000 ක් වූ සම්පූර්ණ මුලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක ට එකතුව රු.17,070,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු. 4,911,701 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 12,158,299 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 41 සිට 94 දක්වා වූ පරාසයක ප්‍රතිශතයන් ගෙන තිබුණි. වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

4.2 අත්තිකාරම් ගිණුම්

4.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

(අ) සීමා පිළිපැදීම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළයුතු අංක 00501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2013 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් පිළිපැද තිබුණි.

(ආ) හිඟ ණයශේෂ

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2012 දෙසැම්බර් 31 දිනට සේවා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවීම් හිඟහිට තිබුණු වර්ෂයකට අඩු ශේෂවල එකතුව රු. 269,458 ක් විය.

4.3 පොදු තැන්පත් ගිණුම

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 434,694 ක් වූ අතර එම ශේෂය වර්ෂයකට අඩු කාල පරිච්ඡේදයකට අදාල විය.

5. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

5.1 වත්කම් කළමනාකරණය

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, කාර්යාලය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 අප්‍රේල් 02 දින වන විටත් පවත්වා නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

(ii) 2011 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් අයිතම 59 ක් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හදුනා ගෙන තිබුණත් 2012 වර්ෂයේ දෙසැම්බර් මස වන විටත් මෙම භාණ්ඩ අපහරණය කිරීම සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 3 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6 ජේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) බේරුම් නොකළ බැරකම්

කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.166,575 ක් වූ අතර එය වර්ෂයකට අඩු කාල පරිච්ජේදයකට අදාල විය.

6. අනුකූල නොවීම්

(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව.	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(i) **මුදල් රෙගුලාසි**		
මු.රෙ. 231 (1) හා (2)	25,725	ගෙවීම් තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

මු.රෙ. 257	36,701	වවුචර සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි.
මු.රෙ. 264 (1)	253,292	වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට ආදායකයාගෙන් සාක්ෂි ලබා ගෙන නොතිබුණි.
මු.රෙ. 1646		දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 චක්‍රලේඛයේ 2 හා 3 ඡේදය	113,255	ආපදා ණය වශයෙන් නිලධාරියා ලබන මාස දහයක වැටුප හෝ රු. 250,000 යන දෙකෙන් අඩු මුදල ලබා දිය යුතු වුවද එම සීමාව ඉක්මවා ණය ශේෂ පැවතුණි.

(iii) භාණ්ඩාගාර චක්‍රලේඛ

2002 නොවැම්බර් 2 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛ		පරිගණක හා පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iv) ජාතික අයවැය චක්‍රලේඛ

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරණ චක්‍රලේඛයේ 1.1.3-1.1.7 දක්වා ඡේද	1,300,936	ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල කාලය තුලදී මාසික ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කර නොතිබුණි.

(v) ගැසට් පත්‍ර

2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය	216,765	රු. 25000 කට වැඩි ගෙවීම් සඳහා රු. 25 ක මුද්දර ගාස්තු අය කර නොතිබුණි.

7. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කාර්යාලය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ අංක 150 යටතේ වාහන ඉල්ලුම් කිරීමේදී නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට ලබාදීම සඳහා බව දක්වා වාහන 04 ක් ලබාගෙන තිබුණි. එම නිලධාරීන් හතර දෙනා පෞද්ගලික වාහන භාවිතා කිරීම (ප්‍රවාහන දීමනාව ලබාගැනීම) හා ලබාගත් වාහන 03 ක් සංචිත වාහන ලෙස භාවිතා කිරීම නිසා වාහන ඉල්ලුම් කිරීමේදී අවශ්‍යතාව නිසි පරිදි හදුනාගැනීමකින් තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) උක්ත චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව කල් බදු ලීසිං ක්‍රමය යටතේ අමාත්‍යාංශ ලේකම් හා සමාන තනතුරකට හිමි උපරිම මිල මට්ටම් සීමාව රු. 5,000,000 ක් වුවද එම සීමාව ඉක්මවා රු.6,750,000 කට (KR - 7399) වාහනයක් ලබාගෙන එය අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිති උපදේශක වරයාට ලබා දී තිබුණි.

8. අවිධිමත් ගනුදෙනු

අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

2009 දෙසැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2010 ජනවාරි 04 දිනැති අංක 09/2958/301/044 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලැබී තිබූ අතර එම අනුමැතිය ලබා ගැනීමට පෙර එනම් 2008 නොවැම්බර් 07 දින මෙම ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු. 2,200,000 ක් ගෙවා තිබුණි.

9. අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2008,2009,2010 වර්ෂවලදී මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කොටස් වශයෙන් රු. 9,249,783 ක් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර 2012 වර්ෂයේදීද මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.මෙසේ වසර ගණනාවක් මුදල් නිෂ්ක්‍රියව පැවතීමෙන් 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරණ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 3 වන ඡේදයේ සඳහන් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වෙත ලැබෙන මුදල් ප්‍රතිපාදන අරපරිස්සමින්, උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීත්වයෙන් යුක්තව පරිහරණය කිරීම පිණිස අදාල බලධාරීන් විසින් සෑම ප්‍රයත්නයක්ම ගත යුතු බවට වූ විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් දක්වා නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සම්පූර්ණ මුදල ගෙවා අවසන් වී වසර 2 ක් ගත වූ පසු මෙම ව්‍යාපෘතිය අවලංගු කර නැවත වායු සමීකරණ 13 ක් සවිකිරීමට යෝජනා කර තිබුණි. ඒ සඳහා ලංකා විදුලි මණ්ඩලයට මෙතෙක් ගෙවා ඇති මුදලින් රු. 4,482,080 ක් අඩුකර ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට 2012 අගෝස්තු 16 දින අංක අමප/12/1102/558/034 මගින් අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව මෙම ගණුදෙනුව ආර්ථික නොවන ගණුදෙනුවක් බව විගණනයේදී අනාවරණය විය.

10. මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

සේවක වර්ගය		අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික් සංඛ්‍යා
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	13	10	03	-
(ii)	තෘතියික මට්ටම	07	06	01	-
(iii)	ද්විතියක මට්ටම	29.	21	08	-
(iv)	ප්‍රාථමික මට්ටම	28	24	04	-
(v)	වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම)	-	03	-	03
	එකතුව	77	64	16	03

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඒ.එම්.ඩී. නයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

CB/A/විගණන/2012 ජේසීබී/සීබී/එම්ජ්එන්ජී/2012 2013-07-

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

විසර්ජන ශීර්ෂය - 05
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
කළමනාකරණ විගණන වාර්තාව - 2012

ඉහත මැයෙන් යුත් ඔබගේ අංක ජේසීබී/සීබී/එම්ජ්එන්ජී/2012 හා 2013-06-06 දිනැති කළමනාකරණ විගණන වාර්තාවේ කරුණු සම්බන්ධව මගේ පැහැදිලිකිරීම් පහතින් සඳහන් කරමි.

1. මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

විගණන වාර්තාවේ දක්වා ඇති මෙහෙවර ප්‍රකාශය නිවැරදිය.

(ආ) ප්‍රධාන කාර්යයන්

"විගණන සඳහා තොරතුරු ලබා ගැනීම" යන මැයෙන් මා වෙත යොමු කරන ලද 2013-05-16 දිනැති ලිපියට අදාළව මවිසින් ඉදිරිපත් කරන ලද 2013-05-17 දිනැති ලිපියෙන් විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු පරිදි, කළමනාකරණ විගණන වාර්තාව - 2012 හි දක්වා ඇති අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය:

(i) අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීමට අදාළ උපදෙස් අමාත්‍යාංශ වෙත ලබාදීම හා එම කාර්යයේදී අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට මඟපෙන්වීම.

(ii) ප්‍රතිපත්ති සම්පාදනය හා ජනරජයේ පාලනය මෙහෙයවීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයටත් ,අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් ,අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයෙන් යුතුව තීරණ ගැනීමට පහසුවන පරිදි ,එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්ති පසුබිම ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත් ,අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කිරීම.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.

(v) අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ නිරීක්ෂණ සමග සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත සහ අමාත්‍ය මණ්ඩලය වෙතත් ඉදිරිපත් කිරීම.

(vi) අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වලදී සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී එළඹී තීරණ ඇතුළත් වාර්තා භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එකී වාර්තා ගරු අමාත්‍යවරුන් වෙතත් ,අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම.

(vii) අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම් සඳහා අවශ්‍ය සියලු සේවාවන් සැලසීම.

(viii) අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අදාළ අමාත්‍යාංශ වෙත දැනුම්දීම.

(ix) වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කිරීම.

(x) අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

2. ගිණුම් ඉදිරිපත් කිරීම.

ගිණුමේ නම	**ශීර්ෂය / ආදායම් සංකේතාංකය/විෂය අංකයන්**	**2012 මාර්තු 12 දිනට ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම**
විසර්ජන ගිණුම	05	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.
රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	**00501**	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.

3. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

3.1 සංයුක්ත සැලැස්ම

අමාත්‍ය මණ්ඩල කාර්යාලයට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය රජයේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ඉටු කරනු ලබන කාර්ය භාරයෙන් වෙනස් වේ. එම නිසා පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන මුදල් චක්‍රලේඛය පරිදි නිශ්චිත කාලරාමු සහිතව සංයුක්ත සැලැස්මකට මෙම කාර්යාලයේ කාර්යභාරය පරිවර්තනය කිරීමේ අපහසුතාව හා අවශ්‍යතාවයක් නොමැති බව 2012-07-16 දිනැති මගේ පැහැදිලි කිරීම්වල 3.1 යටතේ පෙන්වා දී ඇත.

3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

වෙනත් රජයේ ආයතනවලට පැවරී ඇති සංවර්ධන කටයුතු, සේවා සැපයීම් වැනි කාර්යයන්වලට වඩා වෙනස් වූත්, ඒකාකාරී වූත් විශේෂ කාර්යභාරයක නිරතවන අමාත්‍ය මණ්ඩල කාර්යාලය සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති චක්‍රලේඛය අදාළ කර ගැනීම අපහසු බැවින් මෙම කාර්යාලයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැත. මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අදාළ අමාත්‍යාංශවල නිරීක්ෂණ ද ලබාගෙන ඉදිරිපත් කිරීමත්, අමාත්‍ය මණ්ඩල තීරණ නිවැරදි ලෙස සකස් කර අදාළ බලධාරීන් වෙත නිසි වේලාවට යොමු කිරීමත්ය. ඊට අතිරේකව අමාත්‍ය මණ්ඩලය විසින් විටින් විට පවරනු ලබන විවිධ කාර්යයන්හි නිරතවීමට මා හා මගේ කාර්ය මණ්ඩලයට සිදුවේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති ස්ථාවර අමාත්‍ය අනුකමිටු මෙන්ම විටින්විට පත්කරනු ලබන අමාත්‍ය අනුකමිටුවල ක්‍රියාකාරීත්වය පහසු කරලීම ද තවත් කාර්යයකි. සතිපතා සිදුකරන මෙම කටයුතු උක්ත චක්‍රලේඛයේ සඳහන් පරිදි නිශ්චිත කාලරාමු සහිත ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාකාරී සැලැස්මකට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයක් නොපෙනේ. මෙම කාර්යාලය සඳහා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ අපහසුතාවය මගේ අංක සීබී/ඒ/විගණන/2012 හා 2012-07-16 දිනැති පැහැදිලි කිරීම්වල 3.2 හා මගේ අංක සීබී/ඒ/විගණන/2003-ii හා 2013-04-29 දිනැති පැහැදිලි කිරීම්වල 01 යටතේ විගණනය වෙත පෙන්වා දී ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.

3.3 අභ්‍යන්තර විගණනය

මෙම කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම් සීබී/ඒ/විගණන/2012 හා 2012-07-16 දිනැති මගේ පැහැදිලි කිරීම්වල 10(අ) යටතේ විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි. පූර්ණකාලීනව කටයුතු කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට තරම් මූල්‍යමය බැඳීම් සහිත කාර්යභාරයක් මෙම කාර්යාලය තුළ නොමැති බැවින් හා මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය අමාත්‍ය මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සහායවීම බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව මගේ අදහසයි.

3.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ වැටුප් හා වේතන ගෙවීමට හා එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන පමණක් ලබාගන්නා එමෙන්ම විශේෂිත ව්‍යාපෘති කිසිවක් සඳහා ප්‍රතිපාදන වෙන් නොකරනු ලබන ආයතනයක් බැවින් මෙම කාර්යාලයට අදාළව විගණන හා කළමනාකරණ කමිටුවක් මඟින් විමසා බැලීමට තරම් වන බරපතල මූල්‍ය හා පරිපාලන ගැටලු නොමැති නිසා විගණන හා කළමනාකරණ කමිටු පත්කිරීමට පියවර ගෙන නොමැත.

4. ගිණුම්

4.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදන හා වියදම

විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි.

2012 වර්ෂයේ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය මු.රෙ. 66 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය, තත්‍ය වියදම හා ඉතිරිය විගණනයේ පෙන්වා දීම අනුව නිවැරදිය.

(ආ) ප්‍රතිපාදන ඌන උපයෝජනය

(i) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ යෝජිත ලේඛන ආරක්ෂණ හා කළමනාකරණ පද්ධතිය (Document Archiving and Management System) සඳහා වැය විෂය අංක 2502 යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත. මේ සඳහා වූ මුල් යෝජනාව ගැන ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නිලධාරින් සමඟ සාකච්ඡා කිරීමේදී ඉදිරිපත් වූ අදහස් අනුව දිගුකාලීන දැක්මක් සහිතව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු සඳහා නවීණ තාක්ෂණය භාවිතා කිරීමට හැකිවන පරිදි මෙම ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කිරීමට පසුව තීරණය විය. එබැවින් ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 2012 වර්ෂයේදී වැය කිරීමට අවස්ථාවක් නොතිබුණ අතර, ඒ බව විගණනයට ද පිටපතක් සහිතව මගේ අංක සීබී/එෆ්/01/2012 හා 2012-11-16 දිනැති ලිපියෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීමට පියවර ගන්නා ලදී. මේ වනවිට මෙම ව්‍යාපෘතියට අදාළව පත් කරනු ලැබ ඇති තාක්ෂණ ඇගැයුම් කමිටුව විසින් සිය වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු කරනු ඇත.

(ii) මගේ අංක සීබී/ඒ/විගණන/2012-4 හා 2013-04-17 දිනැති ලිපියේ) (01) ආ) (i) , (iii) , (iv (හා) v (හි සඳහන් පරිදි මේ සම්බන්ධයෙන් වන මගේ පැහැදිලි කිරීම් දැනටමත් ඔබ වෙත එවා ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි 2012 .වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී සැලසුම් කළ හා පැවති තත්ත්වයන් මෙම කාර්යාලයේ පාලනයෙන් බැහැර හේතූන් මත වෙනස් වූ බැවින් අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම හේතුකොටගෙන අදාළ ඉතිරිවීම් සිදුවී ඇති බව වැඩි දුරටත් පෙන්වා දෙමි .

4.2 අත්තිකාරම් ගිණුම්

4.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම්

(අ) සීමා පිළිපැදීම

විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි.

(ආ) නිඟ ණය ශේෂ

දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයට ස්ථානමාරුවී ගිය ගණකාධිකාරි එන්.එම්.ඒ.අමරදේව මහතාගේ ර.නි.අ. ගිණුම් ණය ශේෂය වාරික වශයෙන් පියවන ලද අතර, 2012 දෙසැම්බර් මසට සම්පූර්ණ ණය ශේෂය වන රු. 265,772.00 මුදල 2013 ජනවාරි මස ගෙවා නිරවුල් කර ඇත. මෙම කාර්යාලයේ සිට විපක්ෂනායක කාර්යාලයට ස්ථාන මාරුවී ගිය රාජ්‍ය කළමනාකරණ සහකාර ආනන්ද ජයසිංහ මහතාගේ 2012 නොවැම්බර් මස ණය පියවීමේදි අතපසුවීමකින් අත්හැරි තිබූ ණය ශේෂය වන රු. 3,686.00 මුදල මාර්තු මස නිවැරදි කර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

(ඇ) පොදු තැන්පත් ගිණුම්

පොදු තැන්පත් ගිණුමේ 2012-12-31 ට ශේෂය වූ රු. 434,694.15 න් තව දුරටත් ගෙවීමට ඉතිරිව ඇත්තේ රු. 3,91,316.45 ක මුදලක් පමණි. එම මුදල් මෙම වර්ෂයේ නිදහස් කළයුතු රඳවා ගැනිම්ය. පොදු තැන්පත් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සැසඳෙන බව දන්වා මගේ අංක CB/F/02/2012 හා 2013-03-28 දිනැති ලිපියෙන් විගණනයට ද පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපියේ පිටපතක් මේ සමඟ 01 ඇමුණුම වශයෙන් ඔබගේ අවධානය සඳහා ඉදිරිපත් කරමි.

5. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

5.1 වත්කම් කළමනාකරණය

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

මේ වන විට 2011වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් නිර්දේශකර තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි අයිතමයන් අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර 2012 ,වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත .භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල සාමාජිකයන් වශයෙන් පත්කරන ලද වෙනත් ආයතනවල නිලධාරින් වෙත පැවරී තිබූ රාජකාරි බහුලතාව හේතුකොටගෙන සමීක්ෂණ කටයුතු නියමිත පරිදි අවසන් කිරිමට නොහැකි වූ බැවින් විගණනය විසින් නිරීක්ෂණය කර ඇති ප්‍රමාදය සිදුවී ඇත . මින් ඉදිරියට ප්‍රමාදයකින් තොරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු පැවැත්වීමට කටයුතු කළයුතු බවට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

(ආ) බේරුම් නොකළ බැරකම්

2012දෙසැම්බර් 31දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම වූ රුපියල් 166,575.00ක් වූ මුදල සඳහා වන බිල්පත් ලැබී ඇත්තේ 2013ජනවාරි හා පෙබරවාරි මාස වල බැවින් ගිණුම් පියවීමේ අවසාන දිනට ප්‍රථම එම බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වී ඇත .මේ වනවිට අදාළ බිල්පත් සියල්ල නිරවුල් කර ඇති බව විගණනයට වාර්තා කරනු කැමැත්තෙමි.

6. අනුකූල නොවීම්

(අ) නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

(i) මුදල් රෙගුලාසි

මු.රෙ.231(1)හා (2)	රු. 25,725/-	මෙම වටිනාකම 2012 වර්ෂයේ අංක 135,139,179 සහ 187 යන වවුචර මගින් ගෙවා ඇති ගෙවීම්වලට අදාළ වන අතර, එකී සියළුම ගෙවීම් සඳහා බිල්පත් හා කුවිතාන්සි ලැබි ඇති බව තහවුරු කරමි. විගණනය අවස්ථාවේදී එකී බිල්පත් සහ කුවිතාන්සි පසුව අමුණා තැබීමේ අටියෙන් ගොනු ගත කර තිබුණි. කෙසේ වෙතත් මේ වන විට විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි අදාළ ලේඛන වවුචර්වලට ඇමිණීමට කටයුතු කර ඇත. මින් ඉදිරියට මු.රෙ.231(1) හා (2) ප්‍රකාරව කටයුතු කරන ලෙසට අදාළ නිලධාරින්ට අවශ්‍ය

		උපදෙස් ලබාදී ඇත.
මු.රෙ. 257	රු. 36,701/-	මෙම වටිනාකමට අදාළ අංක 60*1,66,67 සහ 205 වවුචර් සඳහා ගෙවීම් කිරීමේදී නිසි අනුමැතිය ලබාගෙන ඇති අතර, නිසි පරිදි ගෙවීම් සහතික කරනු ලැබ ඇත. අත්තිකාරම් ලේඛනයේ හා වැය ලෙජරයේ නිසි පරිදි ගෙවීම් ඇතුළත් කොට සහතික කොට ඇතත් වවුචරය මත අත්සන් යෙදීම අහඹු ලෙස මඟහැරී ගොස් ඇති අතර අදාළ නිලධාරින් ලවා එකී වවුචර් අත්සන් කර නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. එසේම මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් වැළකෙන අයුරින් කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කර ඇති බව ද විගණනයට දන්වනු කැමැත්තෙමි.
මු.රෙ. 264 (1)	රු. 2,53,292/-	මෙම වටිනාකමට අදාළව විගණනය විසින් පෙන්වා දී ඇති සියලුම ගෙවීම් සඳහා නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවූ කුවිතාන්සි ලැබී තිබුනද ඒවා නිසි පරිදි වවුචරයට අමුණා නොතිබීම හේතුවෙන් අසම්පූර්ණ වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් වී ඇත. අදාළ කුවිතාන්සි වවුචර්වලට අමුණා විගණනය පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර මින් ඉදිරියේදී සියලුම ගෙවීම් සඳහා නිසි පරිදි කුවිතාන්සි ලබාගත යුතු බවත් එම කුවිතාන්සි ගෙවීම් වවුචර්වලට අමුණා තැබීමට කටයුතු කරන ලෙසත් අදාළ නිලධාරින් වෙත උපදෙස් දෙන ලදි. මුද්දර ගාස්තු අය නොවී තිබූ අවස්ථාවන්හිදී එම ගාස්තු අයකර ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.
මු.රෙ. 1646		විගණනය විසින් පෙන්වා ඇති පරිදි අදාළ ලේඛන හා දෛනික ධාවන සටහන් නිසි පරිදි විගණනය වෙත ඉදිරිපත් කරන ලෙසට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 චක්‍රලේඛයේ 2 හා 3 ඡේදය	2012 ජනවාරි මස මෙම කාර්යාලයට ස්ථානමාරු ලැබ පැමිණි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සී. ජයසූරිය මහතාගේ සහ ගණකාධිකාරී ඩබ්ලිව්.ඩී.සී.ඩී දිසානායක මහත්මියගේ ණය ශේෂයයන් මෙම කාර්යාලයට ස්ථාන මාරුවී පැමිණෙන අවස්ථාවේ රු. 250,000/- ඉක්මවා තිබූ අතර, 2012 වර්ෂයේ දී කිසිදු නිලධාරියකුට රා.පරි. චක්‍රලේඛ අංක 30/2008 අනුව රු. 250,000/- ඉක්මවා යන පරිදි ණය

ලබාදී නොමැත.

(iii) භාණ්ඩාගාර චක්‍රලේඛ

2002 නොවැම්බර් 02 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛ	ස්ථාවර වත්කම් ලේඛනයේ පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම තොරතුරු අන්තර්ගත වේ. කෙසේ වෙතත් අදාළ චක්‍රලේඛයේ උපදෙස් අනුව ඒ සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීමට පියවර ගනු ලැබේ.

(iv) ජාතික අයවැය චක්‍රලේඛ

2004 ඔක්තෝම්බර් 11 දිනැති අංක 118 චක්‍රලේඛයේ 1.1.3 -1.1.7 දක්වා ඡේද	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මින් ඉදිරියට අදාළ චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාන මාරුවී පැමිණෙන නිලධාරින්ගේ ණය ශේෂ අදාළ කාලය තුළදී මාසික ගිණුම් සාරාංශ මඟින් පියවීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත.

(v) ගැසට් පත්‍ර

2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය	විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අදාළ මුද්දර ගාස්තු අයකර නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර, මින් ඉදිරියට රු. 25,000/- කට වැඩි සියලුම ගෙවීම් සඳහා අදාළවන පරිදි මුද්දර ගාස්තු අයකරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත.

07. **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) විගණනය විසින් දක්වා ඇති පරිදි, අදාළ වාහන අවශ්‍යතාව නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව කටයුතු කර නොමැති අතර, මහා භාණ්ඩාගාරය වෙත වාහන ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට පසු අවස්ථාවන් වලදී ඇතිවූ තත්ත්වයන් යටතේ වඩාත් යෝග්‍යතම පරිදි අදාළ වාහන ප්‍රයෝජනයට ගැනීම පිණිස කටයුතු කර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි. මෙම කාර්යාලයට වාහන ලබාගත්තේ වාහන අනුයුක්ත නිලධාරින් 04 දෙනකු වෙනුවෙන් වුවත් අතිරේක ලේකම්වරුන් දෙදෙනා හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු තම පෞද්ගලික වාහන භාවිතා කිරීමට අවසර ලබාගත් නිසා විගණන දිනය වන 2012-12-06 වනවිට මාස 03 ක කාලයක් සංචිත වාහන වශයෙන් ඉන් මෝටර් රථ තුනක් (03) යොදාගෙන තිබීම සත්‍යයෙකි. එහෙත් දැනට එක් අතිරේක ලේකම්වරයකුට එක් වාහනයක් වෙන්කර දී ඇත. පුරප්පාඩුවී තිබුන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරු අතුරින් එක් තනතුරක් සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ 2013-03-25 දිනැති ලිපිය අනුව ස්ථාන මාරුකර එවනු ලැබූ නිලධාරිනියක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස පත් කරනු ලැබ ඇති අතර, අංක KS - 2455 මෝටර් රථය ඇයට අනුයුක්ත කර ඇත. එසේ පුරප්පාඩුවී ඇති අනෙක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර සඳහා නිලධාරියකු පත්වූ වහාම ඉතිරි මෝටර් රථයද ඔහුට/ඇයට අනුයුක්ත කරනු ඇත. එතෙක් එකී වාහනය සංචිත රාජකාරි සඳහා යොදවා ගනු ඇත.

(ආ) විගණනය විසින් පෙන්වා දී ඇති මෝටර් රථය මෙම කාර්යාලය විසින් මිලදී ගන්නා ලද වාහනයක් නොවන අතර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් මිලදී ගෙන මෙම කාර්යාලය වෙත ලබාදී ඇති මෝටර් රථයකි. අයවැය දෙපාර්තමේන්තුව විසින් එම මෝටර් රථය මෙම කාර්යාලයට වෙන්කර දීමේදී අයවැය චක්‍රලේඛ 150 හි සඳහන් සීමාවන් සැලකිල්ලට ගනු ලැබ ඇති බව මගේ අදහසයි. අදාළ මෝටර් රථය අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකවරයාට අනුයුක්ත කර තිබූ අතර, එම තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයක ලේකම් තනතුරකට සමාන තනතුරක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඉහත (අ) සහ (ආ) කරුණුවලට අදාළ වැඩිදුර පැහැදිලි කිරීම් මගේ අංක සීබී/ඒ/විගණන/2003-ii හා 2013-04-29 දිනැති ලිපියේ 03 හා 04 යටතේ විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව ද තවදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

08. **අවිධිමත් ගණුදෙනු**

අධිකාරි බලය නොමැති ගනුදෙනු

ඔබේ අංක ජේපී/බී/සීබී/2012/1/4/22 දරන විගණන විමසුමට අදාළව මවිසින් ඉදිරිපත් කළ 2013-04-08 දිනැති පැහැදිලි කිරීම්වල මෙම කරුණ සම්බන්ධයෙන් ,දීර්ඝ වශයෙන් කරුණු දක්වා ඇති බව පෙන්වා දෙමි .එකී ලිපියේ පිටපතක් ඔබගේ අවධානය සඳහා මේ සමඟ 02 ඇමුණුම වශයෙන් නැවතත් ඉදිරිපත් කරමි .

අමාත්‍ය මණ්ඩල කාර්යාලය අධි ආරක්ෂක කලාපයක පිහිටුවා තිබීම නිසා පෞද්ගලික ආයතනයක සේවකයින්ට කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීම සඳහා ආරක්ෂක අංශ වෙතින් අවශ්‍ය අවසරපත් ලබා ගැනීමේ ක්‍රියාවලිය ඉතා සංකීර්ණ වූවක් බැවින් ,රජයේ ආයතනයක් වන විදුලිබල මණ්ඩලය වෙත අදාළ කාර්ය පැවරීමටත් ඒ සඳහා 2008වර්ෂයේ වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන රු -/2,200,000 .ක අත්තිකාරම් මුදලක් ලබාදීමටත් ,එවකට සිටි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබ ඇති අතර 23-12-2009 ,දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය සඳහා මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් මේ වනවිට අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ රු. 2,200,000/- ක මුදලද ඇතුලු රු -/95,00,000 .ක වියදමින් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත .ඒ අනුව ,මෙම කාර්යය සඳහා නිසි අනුමැතිය ලබාගෙන ඇති බව පෙන්වා දීමට කැමැත්තෙමි .

09. **අනාර්ථික ගනුදෙනු**

(අ) සහ (ආ) ඉහත 08 හි සඳහන් 2013-04-08 දිනැති මගේ පැහැදිලි කිරීම්වල 01(ඉ) සිට (උ) දක්වා පෙන්වා දී ඇති තත්ත්වයන් යටතේ මෙම කාර්යාලය සඳහා මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් වෙනුවට අත්‍යවශ්‍ය ස්ථාන සඳහා පමණක් වෙන් වෙන්ව වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විගණනය වෙත කරුණු දක්වා ඇත. එබැවින්, මෙම ගණුදෙනුව අනාර්ථික ගනුදෙනුවක් ලෙස නොව පසු අවස්ථාවකදී මතු වූ තත්ත්වයන් යටතේ වඩා යෝග්‍ය පරිදි රජයේ අරමුදල් වැය කිරීමට අදාළව ගනු ලැබූ තීරණයක් සේ සලකා කටයුතු කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

10. **මානව සම්පත් කළමනාකරණය**

(i) මෙම කාර්යාලයේ රාජකාරි ස්වභාවය අනුව අවශ්‍ය සුදුසුකම් සහිත විශේෂයෙන් හඳුනාගත් නිලධාරින් ඔවුන්ගේ එකඟතාවය මත සහ අදාළ බලධාරින්ගේ අනුමැතියෙන් සේවයේ යෙදවිය යුතු බැවින් වෙනත් සාමාන්‍ය රජයේ කාර්යාලයක පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ

ක්‍රමවේදයට පරිබාහිරව මෙම කාර්යාලයේ තනතුරුවල ඇතිවන පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගතයුතු වේ. එබැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම ප්‍රමාදවී ඇත . සුදුසු නිලධාරින් හඳුනාගත් වහාම ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත.

(ii) මෙම කාර්යාලයේ සේවය සඳහා කිසිදු අතිරික්ත සේවකයකු සේවයේ යොදවා නොමැති අතර, කොන්ත්‍රාත් පදනම මත 2012-12-31 දිනට පහත සඳහන් නිලධාරින් සේවයේ යොදවා තිබූ අතර, ඔවුන් සේවයේ යෙදවීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බව පෙන්වා දෙමි.

තනතුර	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති දිනය
1.අමාත්‍ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක	2011-08-24
2. භාෂා උපදේශක (සිංහල/ඉංග්‍රීසි)	2012-05-23
3. භාෂා සම්බන්ධීකාරක (ඉංග්‍රීසි/දෙමළ)	2012-08-08

ඒ අනුව, අදාළ පත් කිරීම් සඳහා විධිමත් අනුමැතීන් ලබාගෙන ඇති බැව් විගණනයට පෙන්වා දෙනු කැමැත්තෙමි. අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ අමුණා ඇත.

පසුගිය කාලය තුළ ඉටු කළ යුතුව තිබූ සුවිශේෂී රාජකාරි රාශියක් හේතුවෙන් මෙම පිළිතුර අපේක්ෂිත කාලය තුළදී ඔබ වෙත යොමු කිරීමට නොහැකි වීම ගැන කණගාටු වෙමි.

එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.